**ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සහ එහි පරිපාලිත - 2022**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1** තත්ත්වාගණනය කළ මතය

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ("සංස්ථාව") සහ එහි පරිපාලිතයන්හි ("සමූහය") 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සංස්ථාවේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංස්ථාව සහ සමූහය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සංස්ථාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංස්ථාවේ සහ සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව සංස්ථාව සහ සමූහය විසින් වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

- ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීම සඳහා සමූහය තුළ ඇති ආයතන හෝ ව්‍යාපාර ක්‍රියාකාරකම්වල මූල්‍ය තොරතුරු සම්බන්ධයෙන් ප්‍රමාණවත් සුදුසු විගණන සාක්ෂි ලබා ගන්නා ලදී. සමූහ විගණනයේ අධීක්ෂණය, කාර්යසාධනය සහ මෙහෙයවීම සම්බන්ධයෙන් අප විසින් වගකියනු ලබයි. මාගේ විගණන මතය සම්බන්ධයෙන් මා සම්පූර්ණයෙන්ම වගකියනු ලබයි.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සංස්ථාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සංස්ථාව සහ එහි සමූහය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිත 01 හි 32 වන ඡේදයට අනුව, ලාභ සහ අලාභ වෙන් වෙන්ව ඉදිරිපත් කළ යුතුව ඇත. කෙසේවුවද ,එවැනි අවශ්‍යතාවයන්ට පටහැනි වන අයුරින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ රු.මිලියන 108,997.26 ක් වූ විනිමය ලාභය රු. මිලියන 636,074.24 ක් වූ විනිමය අලාභ වලට හිලව් කර තිබුණි. | සංස්ථාව විසින් විනිමය අනුපාතයේ වෙනස්වීම වෙනම අයිතමයක් ලෙස ආදායම් ප්‍රකාශනයේ පෙන්වා ඇත. පෙර වර්ෂ වලදී අනුගමනය කරල ලද ක්‍රියාපිළිවෙතම මෙම වර්ෂයේදී ද අනුගමනය කර ඇත. | ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල විය යුතුය. |
| (ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 01 හි 97 වන පරිච්ඡේදයට අනුව “ආදායම් හා වියදම් යටතේ වන අයිතමයන් ප්‍රමාණාත්මක වන විට, ආයතනය විසින් සිය ස්වභාවය සහ වටිනාකම් වෙන්ව අනාවරණය කළ යුතු වේ.” කෙසේ වුවද, සංස්ථාවේ සමාලෝචිත වර්ෂයට අදාළ රු. මිලියන 108,997.26 ක් වූ විනිමය ලාභය රු.මිලියන 636,074.24 ක විනිමය අලාභය වෙන් වෙන් වශයෙන් අනාවරණය කර නොමැත. | සංස්ථාව විසින් විනිමය අනුපාතයේ වෙනස්වීම වෙනම අයිතමයක් ලෙස ආදායම් ප්‍රකාශනයේ පෙන්වා ඇත. පෙර වර්ෂ වලදී අනුගමනය කරල ලද ක්‍රියාපිළිවෙතම මෙම වර්ෂයේදී ද අනුගමනය කර ඇත. | -එම- |

| | | |
|---|---|---|
| (ඇ) සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 01 හි 32 වන පරිච්ඡේදයට පටහැනිව සමාලෝචිත වර්ෂය අවසානයේදී රු. මිලියන 6,303 ක් වූ ගෙවිය යුතු ශේෂයන් වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු හර ශේෂයන් වලට හිලව් කර තිබුණි. | සටහන් කර ගන්නා ලදී. | -එම- |
| (ඈ) LKAS 16 හි අවශ්‍යතාවයන්ට පටහැනිව, රු.මිලියන 3,191.08 ක පිරිවැය වූ සම්පූර්ණයෙන් ක්ෂය කළ වත්කම් සංස්ථාව විසින් අඛණ්ඩව භාවිතා කර තිබුණු අතර එම වත්කම්වල ඵලදායි ජීවකාලය නැවත තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. එමෙන්ම සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට සංස්ථාව සතු ඉඩම් 22 ක් ප්‍රත්‍යාගණනය කර නොතිබුණි. | එම ඉඩම්වල අයිතිය නීත්‍යානුකූලව නිරවුල් කර ගැනීමට අවශ්‍ය පියවර නීතිඅංශය විසින් ගෙන ඇත. මෙම ඉඩම්වල අයිතිය නීත්‍යානුකූලව නිරවුල් කර ගැනීමෙන් අනතුරුව ප්‍රත්‍යාගණන ගැලපීම් ගිණුම් තුළ සිදු කරනු ලබයි. | -එම- |

## 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) අන්තර් සමාගම් ගණුදෙනු** | | |
| (i) සංස්ථාවේ වාර්තා වලට අනුව, පරිපාලිත සමාගම වූ ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමට ගෙවිය යුතු ශුද්ධ වටිනාකම රුපියල් මිලියන 6,211.04 ක් වූ අතර, එය රු. මිලියන 7,458.10 ක ගෙවිය යුතු වටිනාකමකින් සහ රු. මිලියන 1,247.06 ක ලැබිය යුතු වටිනාකමකින් සමන්විත වේ. කෙසේවෙතත්, ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ මූල්‍ය ප්‍රකාශනයට අනුව, සංස්ථාවෙන් ලැබිය යුතු ශුද්ධ වටිනාකම රු. මිලියන 7,164.20 ක් ලැබිය යුතු රු. මිලියන 8,000.36 කින් සහ ගෙවිය යුතු රුපියල් මිලියන 836.16 ක වටිනාකමකින් සමන්විත වේ. එබැවින්, ආයතන දෙකෙහි අන්තර් සමාගම් ගිණුම් ශේෂයන්හි රුපියල් මිලියන 953.16 (පිළිවෙලින් රු. මිලියන 542.26 සහ රු. මිලියන 410.90) ක වෙනසක් නිරීක්ෂණය විය. | සංස්ථාව සහ ඛනිජ තෙල් තොග ගබඩා පයීන්ත සමාගම අතර අන්තර් සමාගම් අතර ගෙවිය යුතු වෙනස වන රු.මිලියන 542.26 ඉතා පැහැදිලිව හඳුනාගෙන ඇත. | මතභේදයට තුඩු දී ඇති සියලුම ශේෂයන් නිරවුල් කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු අතර මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි සංඛ්‍යා ඇතුළත් කළ යුතුය. |
| (ii)සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලට අනුව, ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පයීන්ත සමාගමෙන් සමාලෝචිත වර්ෂය තුළදී අයවිය යුතු පාඩුව රු. මිලියන 14.57 ක් වශයෙන් වාර්තා කර නොතිබුණි.එම හේතුවෙන්, ගෙවිය යුතු ශුද්ධ අන්තර් සමාගම් ශේෂය | කළමණාකරනය විසින් අදහස් දක්වා නොමැත. | (i)නිවැරදි සංඛ්‍යා සටහන් කර අයකර ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුයි.<br><br>(ii) සියලුම ගනුදෙනු/සිදුවීම් මූල්‍ය ප්‍රකාශනවල සටහන් කළ |

| | | |
|---|---|---|
| සහ සංස්ථාවේ මෙහෙයුම් පිරිවැය සමාන අගයකින් අධිතක්සේරු වී තිබුණි. | | යුතුය. |
| (ආ) **ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන** | | |
| (i) ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ 2021 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සමාලෝචිත වර්ෂයේදී නැවත ප්‍රකාශිත කර තිබුණි.කෙසේ වුවද,එලෙස නැවත ප්‍රකාශිත කිරීමේ ප්‍රතිඵලය සමාලෝචිත වර්ෂය තුළදී ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනයන්හී ගැලපීම් කර හෝ අනාවරණය කර නොතිබුණි. ඒ හේතුවෙන් අනෙකුත් මෙහෙයුම් වියදම්,ආදායම් බදු වියදම්, තොග, ලැබිය යුතු ආදායම් බදු සහ රඳවාගත් ඉපැයීම්හි වෙනස්වීම් පිළිවෙලින් රු.මිලියන 27.01, රු.මිලියන 6.48, රු.මිලියන 121.62 , රු.මිලියන 29.19 සහ රු. මිලියන 92.43 වශයෙන් නිරීක්ෂණය විය. | ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම විසින් අනුමත මූල්‍ය ප්‍රකාශන 2023.02.28 ට පෙර ඒකාබද්ධ කිරීම සඳහා පිළියෙල කර ඉදිරිපත් කර නොතිබුණු බැවින් සංස්ථාව විසින් සමූහයේ 2022 වර්ෂයේ ගිණුම් පිළියෙල කිරීම සඳහා 2023.02.21 දිනට පැවති කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන පදනම් කරගන්නා ලදී. | ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි සංඛ්‍යා ඇතුළත් කළ යුතුය. |
| (ii) 2022 වර්ෂයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සහ ලංකා ඛණිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ 2022 වර්ෂය සඳහා වූ අනුමත මූල්‍ය ප්‍රකාශන අතර විකුණුම් පිරිවැය රු.මිලියන 121.62, ආදායම් බදු රු.මිලියන 29.189 සහ රඳවා ගත් ඉපයීම් රු.මිලියන 29.19 ක් වශයෙන් වෙනස්කම් නිරීක්ෂණය විය. | සංස්ථාව විසින් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශාන පිළියෙල කිරීමේදී පරිපාලිත සමාගම් හී ( ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම සහ ට්‍රින්කො පෙට්‍රොලියම් ටෙර්මිනල් ලිමිටඩ්) එදිනට පැවති නිවැරදිම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගන්නා ලදී. එහෙත්, ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම විසින් ඒකාබද්ධ ගිණුම් පිළියෙල කිරීම සඳහා 2023.02.28 දිනට පෙර අවසන් අනුමත මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කර නොතිබුණි. | ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි සංඛ්‍යා ඇතුළත් කළ යුතුය. |

(ඇ) අලෙවි නියෝජිත කොමිස්

2019 ජූලි මස 30 දිනැති අංක 05/1231 දරන අධ්‍යක්ෂක මණ්ඩල තීරණය ප්‍රකාරව අලෙවි නියෝජිතයින්ගේ කොමිස් මුදල් ගෙවීමේ ඉහළ සීමාව නොසලකා හරිමින් අලෙවි නියෝජිතයින් හට කොමිස් මුදල් ගෙවා ඇත. ප්‍රතිපත්තිමය වශයෙන් පහත සඳහන් කර ඇති ඉහල හා පහළ සීමාවන් යටතේ එක් එක් නිශ්පාදන සඳහා ඉහළ හා පහළ සීමාවන් අතර බෙදුම්කරුවන් සතු ඉන්ධන පිරවුම්හල් අලෙවි නියෝජිතයින්ට (DODO) පෙට්‍රල් සහ ඩීසල් සඳහා 3% ක කොමිස් අනුපාතයක් සහ සංස්ථාව සතු ඉන්ධන පිරවුම්හල් අලෙවි CODO අලෙවිකරුවන්ට 2.75% ක කොමිස් අනුපාතයක් තාවකාලික පියවරක් ලෙස අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කර ඇත. භූමිතෙල් සඳහා 2% ක ස්ථාවර කොමිස් අනුපාතයක් ලබා දෙන ලදී. ඒ අනුව 2022 වර්ෂය තුළදී රු.මිලියන 12,410.44 ක් වූ වැඩිපුර ගෙවූ අලෙවි නියෝජිත කොමිස් මුදල විකුණුම් හා බෙදාහැරීමේ වියදම් වශයෙන් වාර්තා කර තිබුණි. ඒ අනුව 2023 සැප්තැම්බර් මස 01 දිනට වැඩිපුර ගෙවූ අලෙවි නියෝජිත කොමිස් මුදල රු.මිලියන 23,576 ක් වී තිබුණි.

ඉහත අධ්‍යක්ෂක මණ්ඩල තීරණය ක්‍රියාත්මක කිරීමට යාමේදී ඛනිජ තෙල් අලෙවිකරුවන්ගේ සංගමය සහ තවත් අලෙවි නියෝජිතයින් හතර දෙනෙකු විසින් නඩු පවරා තිබුණු අතර, ගරු කොළඹ දිසා අධිකරණයෙන් තාවකාලික තහනම් නියෝගයක්ද ලබාගෙන තිබුණි. කෙසේ වෙතත්, 2022 ජූලි 15, එම තහනම් නියෝගය ඉවත්කර තිබුණද, අධ්‍යක්ෂක මණ්ඩල තීරණය ක්‍රියාත්මක කිරීමට සංස්ථාව අපොහොසත් වී තිබුණි.අනතුරුව, අලවිකරුවන් විසින් නැවතත් සිවිල් අභියාචන මහාධිකරණයේ නඩුවක් පවරා තිබූ අතර ගරු අධිකරණය විසින් අධ්‍යක්ෂ මණ්ඩල තීරණ අනුව අලෙවිනියෝජිතයන් හට කොමිස් මුදල් ගෙවීම වළක්වාලමින් අතුරු තහනම් නියෝගයක් පනවා තිබුණි. සංස්ථාවේ මුදල් ඉතිරි කර ගැනීම සඳහා ඉහළ සීමාව නොතකා අලෙවි නියෝජිතයින්ගේ කොමිස් මුදල් ගෙවීම වැළැක්වීම සහ වාරණ නියෝගය ඉවත් කිරීමේ දැඩි අහිතකර බලපෑම පිළිබඳව අධිකරණයට කරුණු තරඟකාරී අලෙවිකරණ පරිසරය තුළ ප්‍රතිසාධන යාන්ත්‍රණය ප්‍රායෝගික නොවිය හැකි බැවින්, අනපේක්ෂිත ඉන්ධන මිල ඉහළ යාම හේතුවෙන් ඉහළ මිල සීමාව ඉක්මවා යාම මත SAP system හි අලෙවිකරුවන්ගේ ගිණුම්වලට ගණනය කර ගිණුම්ගත කර ඇති රුපියල් බිලියන විස්සකට වැඩි මුදලක් ලංකා ඛනිජ තෙල් සංස්ථාවට අත්හැරීමට සිදු විය හැකිය.

අධ්‍යක්ෂ මණ්ඩල තීරණය ක්‍රියාත්මක කිරීමට වහා පියවර ගත යුතු අතර වැඩිපුර ගෙවූ කොමිස් මුදල සම්පූර්ණයෙන් අයකර ගත යුතුය.

| | | |
|---|---|---|
| ඉදිරිපත් කිරීමට සංස්ථාව තවමත් අපොහොසත් වී ඇත. | | |

**(ආ) භූමිතෙල් සහනාධාරය**

| | | |
|---|---|---|
| මහාභාණ්ඩාගාර ලේකම්ගේ 2015 නොවැම්බර් 24 දිනැති අංක FP/06/100/02/2016 සහ 2014 දෙසැම්බර් 04 දිනැති අංක TTIP/1/83/(1)T දරන ලිපි මඟින් කිසියම් මිල අඩුවීමකින් රජයට සිදු වන පාඩුව රජයේ සහනාධාරය ගෙවා අවසන් කිරීමේ එකඟතාවයක් ඇතිව රජය තීරණය කල මිලට සංස්ථාව භූමිතෙල් අලෙවි කරනු ලබයි. 2014 සිට 2022 දක්වා වූ කාලය සඳහා ලැබිය යුතු මුළු සහනාධාර මුදල රු.මිලියන 74,626.54 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසානයේදී රු.මිලියන 4,459 ක් පමණක් මහා භාණ්ඩාගාරය විසින් ප්‍රතිපූර්ණය කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයේ ලැබිය යුතු මුළු සහනාධාරය රු.මිලියන 70,167.26 ක් වුවද, රු.මිලියන 5,097.72 ක් පමණක් ගිණුම්ගත කර තිබුණි.තවද, එම අදායම මත සියලුම ඍජු බදු හා වක්‍ර බදු ගිණුම්ගත කර හෝ ගෙවීම් කර නොතිබුණි. | රජය විසින් රු.මිලියන 4,459 ක් ප්‍රතිපූර්ණය කරන ලද අතර, පසුව වෙනත් කිසිදු ප්‍රතිපූර්ණයක් සිදු කර නොමැති අතර මහා භාණ්ඩාගාරය විසින් ද භූමිතෙල් සහනාධාරය ප්‍රතිපූර්ණය කිරීම සම්බන්ධයෙන් තහවුරු කිරීමක් සිදු කර නොමැත.භූමිතෙල් සහනාධාරය අයකරගැනිම පිළිබද අවධානම් තත්වයක් පවතින බැවින් සංස්ථාව විසින් ගිණුම් තුළ භූමිතෙල් සහනාධාරය හදුනා ගෙන නොමැත. කෙසේ වෙතත්, එම වටිනාකම් නැවත අය කර ගැනීමට අවශ්‍ය කටයුතු අඛණ්ඩව සිදු කරමින් පවතී. | අයකර නොගත් සියලු සහනාධාර අයකර ගැනීමට කටයුතු කල යුතු අතර බදු නීතින් ට අනුව අදාළ වන සියලු බදු ගෙවිය යුතුය. |

### 1.5.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සංස්ථාවේ වාර්තා වලට අනුව, සමාලෝචිත වර්ෂය අවසානයේදී ශ්‍රී ලංකන් ගුවන් සමාගමෙන් ලැබිය යුතු වටිනාකම ඇ.එ.ජ ඩොලර් මිලියන 301.3 ක් වූ අතර, ශ්‍රී ලංකන් ගුවන් සමාගමෙන් ලැබුණු ශේෂ තහවුරු කිරීම් අනුව සංස්ථාවට ගෙවිය යුතු වටිනාකම ඇ.එ.ජ. ඩොලර් මිලියන 235.5 කි. එබැවින්, එම වාර්තා දෙක අතර ඇ.එ.ජ.ඩොලර් මිලියන 65.8 ට සමාන රු.මිලියන 21,070 ක වෙනසක් නිරීක්ෂණය විය. | ශ්‍රී ලංකා ගුවන් සමාගමෙන් ශේෂ සැසදුම් කිරීමට අදාළ වන තොරතුරු ඉල්ලා සිටියද තවත් එම තොරතුරු ලැබී නොමැත. කෙසේ වෙතත්, අංක MF/PE/011/CM/2023/152 දරන 2023.06.26 දිනැති කැබිනට් තීරණයට අනුව 2023.04.30 දිනට ශ්‍රී ලංකා ගුවන් සමාගමෙන් ලැබිය යුතු ශේෂය පියවීමට මහා භාණ්ඩාගාරය විසින් එකග වී ඇත. | ආයතන අතර ඇති නොසැසඳු වෙනස්කම් සියල්ල නිරවුල් කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) මුල්‍ය ප්‍රකාශන වලට අනුව, සමාලෝචිත වර්ෂය අවසානයේදී සමාජ ආරක්ෂණ දායකත්ව බදු (SSCL) වගකීම රු.මිලියන 3,249.6 ක් වූ අතර, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද සමාජ ආරක්ෂණ බදු වාර්තා වලට අනුව එය රු.මිලියන 3,254.5 ක් විය. එබැවින් මුල්‍ය ප්‍රකාශණයේ සහ සමාජ | සංස්ථාව විසින් විවිධ අනෙකුත් ආදායම් මත සමාජ ආරක්ෂණ දායකත්ව බදු එකතු කර දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවන ලදී.අනෙකුත් ආදායම් වලින් ලැබෙන ශුද්ධ ආදායම (Net Tax) අනෙකුත් ආදායම් ලෙස ගිණුම්ගත කර ඇත. ඒ හේතුවෙන්, රු.මිලියන | නිවැරදි බදු වගකීම් මුල්‍ය ප්‍රකාශනවල සටහන් කළ යුතුය. |

| | | |
|---|---|---|
| ආරක්ෂණ දායකත්ව බදු වාර්තා වල පෙන්වා ඇති ශේෂ අතර රු.මිලියන 4.9 ක නොසැසඳු වෙනසක් නිරීක්ෂණය විය. | 4.92 ක් සමාජ ආරක්ෂණ දායකත්ව බදු වියදම් ලෙජර් ගිණුම් තුළ ඇතුළත් කර නොමැත. | |
| (ඇ) මූල්‍ය ප්‍රකාශනවලට අනුව, ඉඩ නොදුන් එකතු කළ අගය මත බද්ද රු.මිලියන 1,348.6 ක් වූ අතර,එකතු කල අගය මත බදු වාර්තා අනුව රු.මිලියන 1,213.6 ක් විය. ඒ අනුව එම ශේෂයන් අතර රු. මිලියන 135.1 ක නොසැසඳෙන වෙනසක් නිරීක්ෂණය විය. | සංස්ථාව විසින් මූල්‍ය ප්‍රකාශනයන්ට අනුව එකතු කළ අගය මත බදු ගණනය කර බදු වාර්තා සංශෝධනය කර ඇත.2022 වර්ෂයට අදාළ කාර්තුමය බදු වාර්තා මූල්‍ය ප්‍රකාශනයන්ට ගැලපෙන අයුරින් සංශෝධනය කිරීමට කටයුතු කරනු ලබයි. | දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමඟ නොගැලපෙන ශේෂයන් සියල්ල නිරවුල් කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඈ) 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව, සමාලෝචිත වර්ෂය අවසානයේ ලංකා විදුලි බල මණ්ඩලයෙන් ලැබිය යුතු වටිනාකම රු.මිලියන 68,454.6 ක් වූ අතර, විදුලි බල මණ්ඩලයේ වාර්තා වලට අනුව එය රු. මිලියන 63,834.6 කි.එබැවින් එම වාර්තා දෙක අතර රු.මිලියන 4,620.0 ක වෙනසක් නිරීක්ෂණය විය. එයින් රු.මිලියන 753.6 ක් වසර 5 ක් පුරා නිෂ්කාශනය නොවී ඉතිරිව පැවතිණි. | සටහන් කරගන්නා ලදී | ලංකා විදුලිබල මණ්ඩලය සමග ඇති නොසැසඳු ශේෂයන් සියල්ල නිරවුල් කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු අතර දිගුකාලීන හිග මුදල් වහාම අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 1.5.4 පරිපාලිත සමාගම්හි මූල්‍ය ප්‍රකාශන මත විගණන මතය

පරිපාලිත සමාගමක් වන ත්‍රිකුණාමලය ඛනිජ තෙල් පයීන්ත (පුද්ගලික) සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ තත්වාගණනය නොකරන ලද මතයක් මා විසින් නිකුත් කරන ලදී. සංස්ථාවේ අනෙකුත් පරිපාලිත සමාගම වන ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පයීන්ත සමාගමේ සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සඳහා වූ විගණන මතය පහත සඳහන් විගණන නිරීක්ෂන හේතුවෙන් තත්වාගනනය කරන ලදී.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 12 හි 34 වන පරිච්ඡේදයට අනුව, ඉදිරියේදී බදු අය කළ හැකි ලාභයක් හැකිතාත් දුරට භාවිතයට නොගත් බදු අලාභ සහ භාවිතයට නොගත් බදු බැර ඉදිරියට ගෙන යාම සඳහා විලම්භිත බදු වත්කම් හඳුනා ගත යුතුය. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය සඳහා භාවිතයට නොගත් බදු අලාභය වන රු.මිලියන 915.3 මත සමාගම විසින් රු.මිලියන 274.7 ක විලම්භිත බදු වත්කම් හඳුනාගෙන නොතිබුණි. | 2022 වර්ෂයේ විලම්භිත බදු ගණනය කිරීමේදී නොසැලකිලිමත්වීම හේතුවෙන් මෙය මගහැරී ඇත. | ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල විය යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) අයිතම 24,175 කින් සමන්විත රු.මිලියන 8,391.6 ක් වටිනා සම්පූර්ණ ක්ෂය වූ වත්කම් සමාගම විසින් එම වත්කම්වල ප්‍රයෝජනවත් ආර්ථික ජීව කාලය තුළ නැවත තක්සේරු නොකර අඛණ්ඩව භාවිත කරන අතර ඒවා ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිත 16 හි 51 වන පරිච්ඡේදයට පටහැනිව ගිණුම්ගත කර ඇත. තවද,සමාගම 2003 වර්ෂයේ ආරම්භයේ සිටම සිය වත්කම් නැවත තක්සේරු කර නොතිබූ අතර ඒ සඳහා නිසි ප්‍රත්‍යාගණන ප්‍රතිපත්තියක් නොතිබුණි. එබැවින්, මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ජංගම නොවන වත්කම් වල සාධාරණ වටිනාකම පිළිබිඹු කර නොතිබුණි. | ඉදිරි අනාගතයේදී ස්ථාවර වත්කම් අගයකිරීම සඳහා සමාගම අමාත්‍යාංශයෙන් සහ අධ්‍යක්ෂක මණ්ඩලයෙන් අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය සැලසුම් සිදු කර ඇත. | -එම- |
| (ඇ) සමාලෝචිත වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශනවල රු.මිලියන 36.8 ක් වටිනා දේපළ, පිරියත සහ උපකරණ නොනිමි ප්‍රාග්ධන වැඩ ලෙස දක්වා ඇත. 2022 දෙසැම්බර් 31 දිනට එම වත්කම්වල ඉදිකිරීම් කටයුතු අවසන් කර භාවිතයට ගත හැකි අයුරින් පවතී. එමෙන්ම, එම වත්කම් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හි 55 වන පරිච්ඡේදයට අනුව ක්ෂය කර නොතිබුණි. | ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම විසින් ප්‍රාග්ධන ව්‍යාපෘතිවල පිරිවැය ප්‍රාග්ධනීකරණය කරනු ලබන්නේ ව්‍යාපෘති සම්පූර්ණ කිරීමේ සහතිකය හෝ ව්‍යාපෘතියේ සමස්ත සම්පූර්ණ කිරීම සඳහා වන තහවුරු කිරීම මඟින් මෙහෙයුම් ආරම්භ කිරීම හෝ ප්‍රාග්ධන වත්කම් භාවිතා කිරීම සඳහා පරිශීලක කාර්යය වෙත වගකීම භාර දෙන අවස්ථාවේදීය. | -එම- |

### 1.5.5 සංවිධානයේ අඛණ්ඩ පැවැත්ම

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| සංස්ථාවේ මෙහෙයුම් ප්‍රතිපලය ලෙස 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා රු.මිලියන 615,053 ක බදු පසු අලාභයක් ලබා ඇති බව අවධානයට යොමු කළ යුතුය. විදේශ විනිමය උච්ඡාවචනයන් හේතුවෙන් අඛණ්ඩව ඇති වූ සෘණාත්මක බලපෑම්,කෙටි කාලීන ණය ගැනීම් සැලකිය යුතු ලෙස ඉහල යෑම නිසා මූල්‍ය වියදම් ඉහළ යාම,නුසුදුසු මූල්‍ය ප්‍රතිපත්ති සහ පෙර වසර වලදී සිදු කළ හෙජින් ගණුදෙනුව නිසා සංස්ථාව විසින් දරන ලද අධික අලාභයේ සෘණාත්මක බලපෑම් හේතුවෙන් සංස්ථාවේ ශුද්ධ වත්කම් තවදුරටත් අඩුවීම යන කරුණු පසුගිය වර්ෂ කිහිපය තුළ විශාල වශයෙන් පාඩු සිදු වීමට බලපා තිබුණි. සංස්ථාව විසින් ලංකා බැංකුව සහ මහජන බැංකුව වෙත ගෙවීමට නියමිතව පැවති රු.මිලියන | සටහන් කරගන්නා ලදී. ලංකා ඛනිජ තෙල් නිතීගත සංස්ථාව ආයතනික සැලැස්මට හා ක්‍රියාකාරී සැලැස්මට අනුව ක්‍රියාත්මක වන අතර, බලාත්මක කළ හැකි අනාගතයක් සඳහා සංස්ථාවට ක්‍රියාකල හැකි බවට විශ්වාසයක් පවතී. එබැවින් සංස්ථාවට අඛණ්ඩව පැවත්මකින් ක්‍රියා කළහැකි බවත් ඒ අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කල හැකි බවට විශ්වාසයක් පවතී. | සංස්ථාවේ මූල්‍ය ස්ථාවරත්වය ඉහළ නැංවීමට කළමනාකාරීත්වය විශේෂ අවධානයක් යොමු කළ යුතුයි. |

884,093 ක ණය සහ බිල්පත් මහා භාණ්ඩාගාරය වෙත මාරු කර තිබූ අතර එම මුදල 2022 දෙසැම්බර් 31 වන දින ප්‍රාග්ධනය වැඩි වූව ලෙස හඳුනා ගෙන සමාලෝචිත වසර අවසානයේදී සංස්ථාව රු.මිලියන 85,712 ක සෘණාත්මක ශුද්ධ වත්මකක් වාර්තා කර ඇත. ඒ අනුව, රාජ්‍ය මූල්‍ය සහාය නොමැතිව සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යෑම ගැටලුසහගත වේ.

### 1.5.6 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **කපාහරින ලද ලැබිය යුතු ශේෂයන්**<br>(අ) ප්‍රමාණවත් තොරතුරු නොමැතිවීම හේතුවෙන්, ( 2021 ජූලි 22 දිනැති අංක 08/1252 දරන අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතියට අනුව) සංස්ථාවේ ගිණුම් පොත්වලින් රු. මිලියන 1,516 ක ලැබිය යුතු ශේෂය කපා හැරීමට අධ්‍යක්ෂක මණ්ඩල අනුමත කර තිබුණි. කෙසේ වුවද, පෙර විගණන වාර්තාවල සඳහන් කළ පරිදි, ලැබිය යුතු මුදල් කපා හැරීමට තීරණයක් ගැනීමට පෙර එම ශේෂය පදනම් කරගත් ගනුදෙනු සහ සිද්ධීන් සමඟ වංචනික ක්‍රියා සිදුවීමට ඇති හැකියාව පරීක්ෂා කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය නිසි ක්‍රියාමාර්ග ගෙන තිබේද යන්න විගණනයේදී තහවුරු කර ගැනීමට නොහැකි විය. එසේම එම ශේෂයට අදාළ ලිපි ලේඛන පවත්වාගෙන යාමට වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව කිසිදු පියවරක් ගෙන නොතිබුණි. තවද, මේ සම්බන්ධයෙන් 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛයේ අවශ්‍යතාවලට සංස්ථාව අනුකූල වී ඇත්ද යන්න විගණනයේදී තහවුරු කර ගැනීමට නොහැකි විය | 2011 වර්ෂයේදී ලෙජර් ගිණුම් තුළට ජර්නල් සටහන් ඇතුළත් කිරීමේදී කපාහැරීමේ ශේෂයන් පැවතුණි. සැප් පරිසනක පද්ධතිය තුළ ප්‍රමාණවත් ලිපිලේඛන දත්ත හා තොරතුරු නොමැතිවීම සහ මූල්‍ය අංශයට එය ස්ථානගත කළ නොහැකිය.<br>අනික් කරුණ වන්නේ භෞතිකව ප්‍රමාණවත් තොරතුරු හා වාර්තා නොමැති බැවින් මෙම ප්‍රමාණයන් ආපසු අය කරගැනීමේ හැකියාවක් නොමැත. | එය චක්‍රලේඛයට අනුගත විය යුතු අතර තොරතුරු තාක්ෂණ සාමාන්‍ය පාලනයන් වැඩිදියුණු කිරීමේදී නිසි වාර්තා පවත්වා ගත යුතුය. |
| (ආ) පෙර විගණන වාර්තා වල සඳහන් කර ඇති පරිදි, වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු වටිනාකම තුළ ඇතුළත් රු.මිලියන 39 ක හර ශේෂයන් සඳහා ප්‍රමාණවත් හා සුදුසු සාක්ෂි විගණනය වෙත ලැබී නොතිබුණි. ඒ අනුව, එම ශේෂ වල නිවැරදිතාවය සහ පැවැත්ම විගණනයේදී සතුටුදායක ලෙස තහවුරු කර ගැනීමට නොහැකි විය. | රු.මිලියන 193.217 න් රු.මිලියන 23.256 ක් පසුව නිරවුල් කර ඇත. මෙම වටිනාකම නීත්‍යානුකූල නඩුවක් පවතින PV තෙල් සමාගමෙන් ලැබිය යුතු වටිනාකම වන රු.මිලියන 130.940 ක් තුළ සමන්විත වේ. | විගණනය සඳහා ප්‍රමාණවත් හා සුදුසු සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

### 1.5.7 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අ) මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන පරිදි ලැබිය යුතු වෙළඳ ශේෂයන් සහ ගණුදෙනුකරුවන් 48 දෙනෙකුගෙන් සෘජුවම ලැබුණු ශේෂ තහවුරු කිරීම් අතර රු.මිලියන 413.8 ක වෙනසක් පැවතිණි, එම ගණුදෙනුකරුවන් 48 අතරින් ගණුදෙනුකරුවන් 12 දෙනෙකු විසින් තහවුරු කරන ලද ශේෂය ලෙජර් ගිණුම් වල දැක්වෙන ශේෂයට වඩා රු.මිලියන 32.9 කින් වැඩි වී ඇති අතර අනෙකුත් ගණුදෙනුකරුවන් 36 දෙනෙකු විසින් තහවුරු කරන ලද ශේෂය ලෙජර් ගිණුම්වල පෙන්වා ඇති ශේෂයට වඩා රු.මිලියන 380.9 කින් අඩු විය. | මෙම වෙනසට හේතු වන්නේ මාසික උපයෝගීතා ගාස්තු, දිරිදීමනා, කොමිස් මුදල්, උපලබ්ධි නොවූ චෙක්පත් යනාදිය වේ. | සියලු නොසැසඳූ ශේෂයන් නිරවුල් කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන පරිදි වෙළඳ ලැබිය යුතු වයස් විශ්ලේෂණයට අනුව, රු.මිලියන 908.0 ක අගයකින් යුත් හර ශේෂයන් 69 ක් සහ රු.මිලියන 8.7 ක වටිනාකමින් යුත් බැර ශේෂයන් 44 ක් වසර 05 කට වැඩි කාලයක් ආපසු අයකර නොගෙන/නොවිසඳී පැවතිණි. ඒ අනුව, එම ශේෂයන්හී නිරවද්‍යතාවය සහ පැවැත්ම විගණයේදී තහවුරු කර ගැනීමට නොහැකි විය. | වසර 5 කට වැඩි වෙළඳ ලැබිය යුතු හර ශේෂයන් සහිත ගණුදෙනුකරුවන් 75 ක් හඳුනාගෙන අදාල අනුමැතියන් සහිතව නිශ්කාෂණය කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී. | දිගුකාලීන හිඟ ලැබිය යුතු ශේෂයන් අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතු අතර, ප්‍රතික්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතුය. |
| (ඇ) වසර 05 කට වැඩි කාලයක් සඳහා හිඟව පැවති රු. මිලියන 137 ක අගයකින් යුත් හර ශේෂයන් 12 ක් සහ වසර 01 සිට 05 දක්වා කාලය තුළ හිඟව පැවති රු. මිලියන 44 ක අගයකින් යුත් හර ශේෂයන් 13 ක් වර්ෂය අවසානයේ සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශනවල වෙළෙඳ සහ අනෙකුත් ගෙවිය යුතු ශේෂය යටතේ දක්වා තිබුණි. තවද, එම හර ශේෂයන් අයකර ගැනීමට කඩිනම් පියවර නොගෙන සංස්ථාව පසුකාලීනව එම පාර්ශවයන් සමඟ ගනුදෙනු කර ඇති බවද නිරීක්ෂණය විය. එබැවින් එම ශේෂවල නිරවද්‍යතාවය සහ පැවැත්ම විගණනයේදී සැක සහිත විය. | නීතිමය නඩුවක් පවතින PV Oil වෙතින් ලැබිය යුතු රුපියල් මිලියන 130.940 ක් මෙම වටිනාකම තුළ ඇතුළත්ව පවතී.අනෙකුත් හර ශේෂයන් පරික්ෂා කිරීම් සිදුකිරීම් පවතී. වසර 05ට වැඩි නැවිගත කිරීමේ ඇපකරය නිදහස් කරන ලෙස බැංකු වෙත තවදුරටත් ඉල්ලීමක් කර ඇත. | වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු දිගු කාලීන හර ශේෂයන් පියවීමට හෝ ප්‍රතිකර්ම ලබා ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) අංක PED/01/2021(1) දරන 2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛය-රජය සතු ව්‍යවසාය සඳහා මෙහෙයුම් අත්පොත. | | | |
| (i) මාර්ගෝපදේශ 2.3 | ලිහිසි තෙල් ව්‍යාපාරය,තාර ව්‍යාපාරය,නැව් තෙල් ව්‍යාපාරය සහ කෘෂි ව්‍යාපාරය සඳහා අදාළ ප්‍රධාන ක්‍රියාකාරකම් අන්තර්ගත ක්‍රියාපටිපාටි අත්පොත් සංස්ථාව විසින් පිළියෙල කර නොතිබුණි. | සංස්ථාවේ ලිහිසි තෙල් ව්‍යාපාරය, බිටුමන් ව්‍යාපාරය, බංකරින් ව්‍යාපාර සහ කෘෂි ව්‍යාපාර සඳහා අත්පොත සකස් කිරීම සඳහා තොරතුරු රැස් කරමින් පවතින අතර, අත්පොත් සඳහා කෙටුම්පත් සකස් කරමින් පවතී. | අදාළ මාර්ගෝපදේශයට අනුකූල විය යුතුය. |
| (ii) මාර්ගෝපදේශ 7.7 | සංස්ථාවේ අධ්‍යක්ෂක මණ්ඩලය විසින් පරිපාලිත සමාගම්හි කාර්‍යසාධනය අධීක්ෂණය සඳහා පහසුකම් සැලසීම සඳහා ව්‍යුහයක් ස්ථාපිත කර නොතිබුණි. | සටහන් කර ගන්නා ලදී | -එම- |
| (ආ) අංක PED/01/2021(i) දරන 2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛය-රජය සතු ව්‍යවසායන්හි ආයතනික පරිපාලනය සඳහා මෙහෙයුම් අත්පොත | | | |
| (i) මාර්ගෝපදේශ 2.2.5(අ) | සංස්ථාව ලාභාංශ ,ප්‍රාග්ධනයේ කොටස් හිමිකාරිත්වයේ වෙනස්වීම් සහ ප්‍රධාන ගණුදෙනු ඇතුළු ගැටළු ආමන්ත්‍රනය කරන පරිපාලිත ආයතන සඳහා ප්‍රතිපත්තියක් ස්ථාපිත කර නොතිබුණි. | සටහන් කර ගන්නා ලදී | -එම- |
| (ii) මාර්ගෝපදේශ 2.2.5 (ආ) | • සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය එහි අනුබද්ධ සමාගම්වල කටයුතු පුළුල් නියාමන සහ නීතිමය රාමුව තුළ සමාලෝචනය | සටහන් කර ගන්නා ලදී | -එම- |

| | | | |
|---|---|---|---|
| | කිරීමේ වගකීම භාරගෙන නොතිබුණි.එබැවින් සංස්ථාව විසින් පරිපාලිත සමාගම්වල ක්‍රියාකාරිත්වය අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම්වලදී නිරන්තර සමාලෝචනයට ලක් කර නොතිබුණි.<br>• සංස්ථාව විසින් පරිපාලිත සමාගම්වල අන්තර් සමාගම් ගණුදෙනු අධීක්ෂණය කර නොතිබුණි.<br>• | | |
| (ඇ) 1869 අංක 17 දරන රේගු ආඥාපනත ( පරිච්ඡේද 235) සහ මේ දක්වා ගෙවිය යුතු බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශ ලේකම්ගේ අංක TIP/TP/09/06-02/21 දරන 2021 දෙසැම්බර් 30 දිනැති ලිපිය | 2011 සිට 2022 දක්වා කාලයට අදාළ ගෙවිය යුතු සමුච්චිත රේගු බදු වූ රු.මිලියන 42,581 ක්, ප්‍රතිපාදනයන්ට පටහැනිව නියමිත කාලයන් තුළ ගෙවා නොමැත. එමෙන්ම, හිග තීරු බදු ගෙවීම සම්බන්ධයෙන් මහා භාණ්ඩාගාර ලේකම් විසින් නිකුත් කරන ලද උපදෙස්වලට අනුව ක්‍රියා කර නොතිබුණි. | 2022 වර්ෂය තුළ ලැබුණු සියලුම භාණ්ඩ සඳහා තාවකාලික රේගු බදු ගෙවනු ලබන අතර, සත්‍ය තීරුබදු ගණනය කිරීම් සහ ඉහත භාණ්ඩ සඳහා ගෙවන ලද තාවකාලික තීරුබදු අතර යම් වෙනසක් තිබේ නම්, වෙනස රේගු අධ්‍යක්ෂ ජනරාල් වෙත පියවනු ලැබේ. | -එම- |
| (ඇ) 2019 අංක 20 දරන ජාතිය ගොඩනැගීමේ බදු ( සංශෝධිත) පනත | 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ හඳුනාගෙන තිබූ ජාතිය ගොඩනැගීමේ බද්ද (NBT) වශයෙන් ගෙවිය යුතු රු.මිලියන 3,243 ක් නිරවුල් කිරීමකින් තොරව පනතේ විධිවිධාන වලට පටහැනිව දීර්ඝ කාලයක් ගිණුම් පොත් වල පැවතිණි. එමෙන්ම, සංශෝධිත NBT වාර්තා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර නොතිබුණි. | පාඩු ලබන තත්ත්වය සහ සෘණ කොටස් ප්‍රාග්ධන තත්ත්වය හේතුවෙන් සංස්ථාව බොහෝ මුදල් ප්‍රවාහ හිඟයන්ට සහ දුෂ්කරතාවන්ට මුහුණ දෙනු ලබයි. එබැවින්, වෙන් කරන ලද රු. මිලියන 2,627 ක මුදල නිරවුල් කර නොමැති අතර, හිඟ බදු සම්බන්දයෙන් සාකච්ඡා කිරීම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමග පැවති රැස්වීම් හරහා අදාළ වගකීම් පිළිබඳව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත දන්වා ඇත. | සංශෝධිත ජාතිය ගොඩනැගීමේ බදු ප්‍රතිලාභ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු අතර දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කිරීමෙන් පසුව නොවිසඳුනු සියලුම ශේෂයන් ඉවත් කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1. මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රුපියල් මිලියන 615,053.1 ක අලාභයක් ලබා තිබූ අතර පෙර වර්ෂයේ අනුරූපී පාඩුව රුපියල් මිලියන 81,816.4 ක් විය. එබැවින් මූල්‍ය ප්‍රතිඵලයේ රුපියල් මිලියන 533,236.7 ක පිරිහීමක් නිරීක්ෂණය විය. විනිමය අනුපාත විචලනයන් මූල්‍ය වියදම් සහ විකුණුම් සහ බෙදාහැරීමේ වියදම් පිළිවෙලින් රුපියල් මිලියන 493,789.9 , 93,891.3 සහ රුපියල් මිලියන 10,296.1 කින් ඉහළ යාම මෙම පරිහානියට හේතු වන්නේය.

### 2.2. අනුපාත විශ්ලේෂණය

ලබා දී ඇති තොරතුරු වලට අනුව, සමාලෝචිත වර්ෂය සහ පූර්ව වර්ෂය සඳහා සංස්ථාවේ සහ සමූහයේ වැදගත් ගිණුම්කරණ අනුපාත කිහිපයක් පහත දැක්වේ

| | සංස්ථාව | | සමූහය | |
|---|---|---|---|---|
| **අනුපාත** | **2022** | **2021 (නැවත ප්‍රකාශිත)** | **2022** | **2021 (නැවත ප්‍රකාශිත)** |
| **ලාභදායීත්ව අනුපාත** | | | | |
| දළ ලාභ/(අලාභ) අනුපාතය (%) | 3.47 | (0.70) | 2.93 | (2.01) |
| මෙහෙයුම් ලාභ/(අලාභ) අනුපාතය (%) | (0.54) | (7.07) | (0.61) | (6.83) |
| ශුද්ධ ලාභ/ (අලාභ) අනුපාතය (%) | (53.54) | (13.99) | (53.74) | (13.79) |
| **ද්‍රවශීලතා අනුපාත** | | | | |
| ජංගම අනුපාතය (වාර ගණන) | 0.77 | 0.48 | 0.79 | 0.49 |
| ක්ෂණික අනුපාතය (වාර ගණන) | 0.51 | 0.42 | 0.53 | 0.44 |
| **ආයොජන අනුපාත** | | | | |
| ප්‍රාග්ධනය මත ප්‍රතිලාභය (ROCE) (%) | (701.13) | (16.28) | (1641.13) | (33.22) |
| තෝලන අනුපාතය (වාර ගණන) | 3.84 | 1.46 | 5.18 | 1.56 |

පෙර වසරට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය තුල සංස්ථාවේ දළ ලාභ/(අලාභ) අනුපාතය සහ මෙහෙයුම් ලාභ /අලාභ අනුපාතිකය පිළිවෙලින් සියයට 596 කින් සහ සියයට 92 කින් ඉහළ ගොස් තිබූ අතර වසර තුලදී ශුද්ධ ලාභ/අලාභ අනුපාතය සියයට 283 කින් අඩුවී ඇත.
සංස්ථාවේ සේවයේ යොදවා ඇති ප්‍රාග්ධනය මත ප්‍රතිලාභ පෙර වසරට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය තුල සියයට 4206 කින් අඩු වී ඇත.

## 3. මෙහෙයුම් සමාලෝචන

### 3.1. කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) මාසික උපයෝගීතා ගාස්තු අය කර ගැනීම (MUF)**<br>2013 ඔක්තෝබර් 29 දිනැති අංක 38/1140 දරන, අධ්‍යක්ෂ මණ්ඩල තීරණයට අනුව සංස්ථාව සතු බෙදුම්කරුවන් විසින් ක්‍රියාත්මක කරන (CODO) පිරවුම්හල්වලින් සහ භාණ්ඩාගාරය සතු බෙදුම්කරුවන් විසින් ක්‍රියාත්මක කරන (TODO) පිරවුම්හල් වලින් මාසික උපයෝගීතා ගාස්තුවක් (MUF) අය කිරීම 2014 ජනවාරි 01 දින සිට බල පැවැත්වෙන පරිදි අනුමැතිය ලබා දී තිබුණි. කෙසේ වෙතත්, මෙම තීරණය සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කර නොතිබුණු අතර සංස්ථාව සතු බෙදාහරින්නන්ගේ (CODO) පිරවුම්හල් සහ භාණ්ඩාගාරයට අයත් බෙදාහරින්නන්ගේ (TODO) පිරවුම්හල් වලින් 11 දෙනෙකුගෙන් පමණක් මාසික උපයෝගීතා ගාස්තුව අයකරගෙන තිබුණි.ඒ අනුව 2022 වර්ෂය අවසන් වන දිනට අයකර නොගත් MUF මුදල රු.මිලියන 3,416 ක් දක්වා වර්ධනය වී තිබුණි. | සියලුම සංස්ථාව සතු බෙදාහරින්නන්ගේ (CODO) කාණ්ඩයේ අලෙවිකරුවන් වෙත 2023 ජූලි 01 දින සිට MUF අය කරනු ලබන අතර සෑම මසකම 25 වැනි දිනට අදාළ MUF ගෙවිය යුතු බවට 2022 ජූලි 05 දිනැති අංක 1053 චක්‍රලේඛය නිකුත් කර ඇත.කෙසේ වෙතත් ගරු අමාත්‍යවරයා සහ රාජ්‍ය අමාත්‍යවරුන් අලෙවි නියෝජිත සංගමය විසින් පවත්වන ලද සාකච්ඡා කිහිපයකින් පසු මෙම තීරණය ක්‍රියාත්මක නොවීය. | අධ්‍යක්ෂ මණ්ඩල තීරණ ප්‍රමාදයකින් තොරව ක්‍රියාත්මක කළ යුතුයි. වගකිවයුතු පාර්ශ්වයන්ගෙන් ආදායම් අහිමිවීම අයකර ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) පොදු පරිශීලක පහසුකම් සම්බන්ධයෙන් පහත සඳහන් ගැටළු පෙර විගණන වාර්තා වල නැවත නැවතත් අවධාරණය කර තිබුණද ඒවා නිවැරදි කිරීමට සංස්ථාව කඩිනම් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | | |
| (i) පොදු පරිශීලක පහසුකම් කොටස් හිමියන්ගේ ගිවිසුම 2008 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වී තිබුණද, ආයතන සඳහා පාලන ක්‍රියාපටිපාටි සහ පර්යන්ත ගාස්තු සහ ස්ලැබ් ගාස්තු ඇතුළු ප්‍රවාහන වියදම් තීරණය කිරීම සඳහා භාවිතා කරන මිල සූත්‍රය ඇතුළුව එම ගිවිසුම යටතේ ආවරණය වන පොදු පරිශීලක පහසුකම් ගිවිසුමෙහි අදාල සියළු පාර්ශවයන්ගේ එකඟතාවය ඇතිව සංශෝධනය කර නොතිබුණි. | 2019 වසරේ ප්‍රතිදාන ගාස්තුව සහ ප්‍රවාහන වියදම් තීරණය කිරීම සඳහා CPC සහ CPSTL අතර ගිවිසුමක් අත්සන් කර ඇත.එකඟ වූ සූත්‍රය ඉදිරිපත් කිරීමට වෙනමම කමිටු පත් කර ඇත.කමිටු නිර්දේශය අනුව අවසන් සංශෝධනය 2019 අප්‍රේල් මාසයේදී සිදු කර ඇත.එදිනට පසුව කිසිදු සංශෝධනයක් සිදු කර නොතිබුණි. | සංස්ථාව සම්බන්ධ සියලු පාර්ශ්වයන්ගේ සහයෝගයෙන් ප්‍රමාදයකින් තොරව ගිවිසුමකට එළඹිය යුතුය. |

| | | |
|---|---|---|
| (ii)ඛනිජ තෙල් නිෂ්පාදන ගබඩා කිරීම සහ ප්‍රවාහනය කිරීම සම්බන්ධ නියමයන් සහ කොන්දේසි සහ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සහ ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම අතර පර්යන්ත ගාස්තු තීරණය කිරීමේ ක්‍රමය ඇතුළත් වන පරිදි සංස්ථාව 2019 මැයි 13 වන දින LIOC හැර CPSTL සමඟ ගිවිසුමකට එළඹ ඇත. 2003 දෙසැම්බර් 30 දිනැති පොදු පරිශීලක පහසුකම් කොටස් හිමියන්ගේ ගිවිසුමේ (GOSL/CPC/LIOC) ප්‍රධාන පරිශීලකයෙකු සහ පාර්ශවයක් වන LIOC වෙතද එම නියමයන් සහ කොන්දේසි එලෙසින්ම අදාළ වුවද ලංකා ඉන්දියානු තෙල් සමාගම මෙහිදී සැලකිල්ලට ගෙන නොතිබුණි.එබැවින් සංස්ථාව සහ CPSTL අතර පවත්නා නියමයන් සහ කොන්දේසි LIOC විසින් ප්‍රතික්ෂේප කරන ඕනෑම අවස්ථාවක යම් අහිතකර තත්වයන් සහ පිරිවැය කෙරෙහි යම් බලපෑමක් සංස්ථාව විසින් දැරිය යුතු බව නිරීක්ෂණය විය | CPSTL විසින් CPC වෙත සපයනු ලබන සේවාවන් සඳහා 2019 දී අත්සන් කරන ලද ගිවිසුම CPC සහ CPSTL අතර වේ. CPSTL සහ LIOC අතර නියමයන් සහ කොන්දේසි මෙම ගිවිසුමට ඇතුළත් කළ නොහැක. | සංස්ථාව සම්බන්ධ සියලු පාර්ශ්වයන්ගේ සහයෝගයෙන් ප්‍රමාදයකින් තොරව ගිවිසුමකට එළඹිය යුතුය. |
| (iii)2003 දෙසැම්බර් 30 දිනැති පොදු පරිශීලක කොටස්හිමියන්ගේ ගිවිසුම ප්‍රකාර (CPC/LIOC සහ GOSL) අතර 2019 මැයි 13 දිනැති සංස්ථාව සහ CPSTL සමග එළැඹි ගිවිසුම අනුව නල මාර්ගයේ හෝ එහි කොටසක් පිළිගත් ප්‍රමිතීන්ට අනුව පවත්වාගෙන යාම සහ මාස දෙකකට අවශ්‍ය ඉන්ධන තොග පවත්වාගෙන යාමට ගබඩා කරන පහසුකම් සැපයීම CPSTL හි වගකීමක් විය.කෙසේ වෙතත් නල මාර්ගයේ අවහිරතා සහ ගබඩා කරන පද්ධතියේ අකාර්යක්ෂමතා හේතුවෙන් නෞකාවකින් තෙල් ගොඩබෑමේදී සිදුවන ප්‍රමාද වීම් හේතුවෙන් සංස්ථාවට සේවා සැපයුම්කරුවන් වෙත ප්‍රමාද ගාස්තු ලෙස එම පිරිවැය මාරු නොකරන එම ප්‍රමාද ගාස්තු ගෙවීමට සිදුවිය. | CPSTL විසින් පවත්වාගෙන යනු ලබන නීතිමය යටිතල පහසුකම් හේතුවෙන් විසර්ජන වරායේ අමතර කාලය තුළ යාත්‍රා සඳහා CPSTL වෙත සැපයුම්කරුවන් විසින් ඉදිරිපත් කරන ලද හිමිකම් මුදල් අයකර ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කර අනුමැතිය ලැබී ඇත. | සංස්ථාවට සහ සමස්තයක් ලෙස රටට වන පිරිවැය අවම කිරීම සඳහා කළමණාකාරීත්වය විසින් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (iv)සංස්ථාව විසින් 2019 වර්ෂයේදී කොළඹ වරායේ සිට කොලොන්නාව පර්යන්තය දක්වා විශ්කම්භය අඟල් 12 සහ මීටර් 5,500ක් දිග නල මාර්ගයක් ප්‍රතිසංස්කරණය කිරීමට අදාළව නාගරික සංවර්ධන අධිකාරියට රු. මිලියන 250ක් ගෙවා තිබුණි. විගණනයට ලැබී ඇති | 2021.07.28 දින පැවති අමාත්‍යාංශ විගණන කමිටු රැස්වීමේදී CPSTL හි සභාපතිවරයා විසින් දන්වා සිටි ආකාරයට ඒ සඳහා වැය වූ රු. මිලියන 250ක මුදල නැවත සංස්ථාවට ගෙවිය යුතුය. | CPSTL සමඟ සාකච්ඡා කර ප්‍රතිසාධන යාන්ත්‍රණය ස්ථාපිත කිරීමට පියවර ගත යුතුය. |

| | | |
|---|---|---|
| තොරතුරුවලට අනුව, ගෙවූ මුදල අනාගතයේදී අයකර ගැනීම සඳහා සංස්ථාව CPSTL සමඟ කිසිදු ගිවිසුමක් හෝ සාකච්ඡාවක් සිදු කර නොමැත. | | |
| (v)රට තුල ඉන්ධන සැපයීම සඳහා ගබඩා සහ පර්යන්ත පහසුකම් වලට අදාල යටිතල පහසුකම් සංවර්ධනය සඳහා මෙහෙයුම් ගාස්තු ලෙස රු.මිලියන 62000 ක් CPSTL වෙත ගෙවා ඇත.කෙසේ වෙතත් නව යටිතල පහසුකම් සැලසුම් කිරීමට සහ සංවර්ධනය කිරීමට සහ පවතින පහසුකම් කඩිනමින් නඩත්තු කිරීමට CPSTL ආයතනය නිසි ක්‍රියාමාර්ග ගෙන තිබේද යන්න තහවුරු කිරීමට ප්‍රමාණවත් සහ සුදුසු සාක්ෂි නොතිබුණි. | සටහන් කරන ලදී. | CPSTL වෙත මාරු කරන ලද අරමුදල් අපේක්ෂිත අරමුණු සඳහා භාවිතා කරන බව සහතික කිරීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ)ඉන්ධන තොග ගබඩා කිරීම බෙදා හැරීම ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අවසරලත් සීමාවන් ඉක්මවා ඇති සියළුම පාඩු, CPSTL වෙතින් අයකර ගැනීමට හිමිකම් සංස්ථාව සතුය.කෙසේ වෙතත් 1968 ජුනි 17 වැනි දින ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ අධ්‍යක්ෂක මණ්ඩලය විසින් තීරණය කරන ලද ඩිපෝ තොග පාඩු වල අවසරලත් සීමාවන් දශක පහකට වැඩි කාලයක් සංස්ථාව විසින් නැවත ඇගයීමට ලක් කර යාවත්කාලීන කර නොතිබුණි.සමාලෝචිත වර්ෂය සඳහා මෙහෙයුම් අලාභය රු මිලියන 468.85 කි. | 2022 වසරේ සැබෑ මෙහෙයුම් අලාභය අවසර ලත් සීමාවන්ට වඩා අඩු විය. කෙසේ වෙතත්, CPC සහ CPSTL නිලධාරීන්ගෙන් සමන්විත විශේෂ කමිටුවක් පත් කර අවසර ලත් සීමාවන් නැවත ඇගයීමට කටයුතු කර ඇත. CPC හි නිලධාරීන් විසින් කරන ලද නිර්දේශ, CPSTL විසින් පිළිගෙන නොමැති අතර, CPC සහ CPSTL ගිවිසුමට මෙය සංස්ථාගත කිරීමට නොහැකි වූ බැවින් අවසාන තීරණය බලාපොරොත්තුවෙන් සිටී. | මෙහෙයුම් අලාභය සම්බන්ධයෙන් අවසර ලත් සීමාවන් නැවත ඇගයීමට හා යාවත්කාලීන කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඈ)2007 සිට 2009 දක්වා කාලය තුල තෙල් ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් සිදු වූ හෙජින් ගනුදෙනුවලට අදාළව සිදු කරන ලද විගණන පරීක්ෂණයට අනුව ,2022 දෙසැම්බර් 31 දිනට එම ගනුදෙනු නිසා රටට සිදු වූ මුළු පාඩුව රු.මිලියන 14,028 කි.තවද, කොමර්ෂල් බැංකුව විසින් ඇ.ඩොලර් 8,648,300 ක මුදලක් ඉල්ලා සංස්ථාවට එරෙහිව කොළඹ වාණිජ මහාධිකරණයේ නඩුවක් ගොනු කර තිබුණි. | කොමර්ෂල් බැංකුව සහ CPC අතර නඩුව තවමත් අධිකරණයේ විභාග වෙමින් පවතී | ප්‍රශ්නය ඉක්මනින් විසඳා ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඉ)පෙර විගණන වාර්තාවල සඳහන් කල පරිදි,2005 දී නිකුත් කරන ලද SAP ERP පද්ධතියේ ආරම්භක අනුවාදය (SAP ECC 6.0) සංස්ථාව විසින් කිසිදු යාවත්කාලීන කිරීමකින් තොරව 2010 අප්‍රේල් 01 දින සිට භාවිත කරනු | අනුවාද යාවත්කාලීන කිරීම සම්බන්ධයෙන් SAP සූදානම් සමීක්ෂණය සිදු කිරීම සඳහා SAP නිර්දේශිත පාර්ශවයට CPSTL ප්‍රදානය කරන ලදී. CPC සහ CPSTL සවිස්තරාත්මකව | SAP පද්ධතිය වැඩිදියුණු කිරීමට කඩිනම් පියවර ගත යුතුය. |

| | | |
|---|---|---|
| ලැබේ.බලශක්ති අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් අංක ADM/12/01/19 දරන 2021 අප්‍රේල් 09 දිනැති ලිපිය මඟින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සහ ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ සභාපතිවරයාට SAP පද්ධතිය භාවිතය සම්බන්ධයෙන් ශක්‍යතා අධ්‍යනයක් සහ මුදලේ වටිනාකම පිළිබඳ විගණනයක් සිදු කරන ලෙසත්, යල් පැන ගිය පද්ධතියක් භාවිතා කිරීමේ අවදානම වැලැක්වීම සඳහා මෙහෙයුම් කමිටුවේ නිර්දේශයන්ට අනුකූලව අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙසත් උපදෙස් දුන්නේය. කෙසේ වෙතත්, SAP පද්ධතිය වැඩිදියුණු කිරීමට සංස්ථාව කඩිනම් පියවර ගෙන නොතිබුණි. | සුදානම් වාර්තාව ලැබීමෙන් පසු අනුවාද උත්ශ්‍රේණි කිරීම සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතුය. | |
| (ඊ) විදෙස් සැපයුම්කරුවන්ගෙන් ලැබියයුතු දෑ<br>විගණනයට ලැබුණු තොරතුරු වලට අනුව ,2012 සිට 2018 දක්වා කාලය තුළ ඩොලර් මිලියන 4.39 ට සමාන රුපියල් මිලියන 1632 ක දඩ මුදලක් ප්‍රමාද වී භාරදීම / අඩුවෙන් පැටවීම, පිළිගත නොහැකි ගුණාත්මකභාවය සහ මිල වෙනස්කම් හේතුවෙන් සිදුවන පාඩු සඳහා දඩ මුදල් ලෙස සැපයුම්කරුවන්ගෙන් අයකර ගැනීමට සිදුව ඇත.කෙසේ වෙතත්,සමාලෝචිත වර්ෂය අවසන් වන තුරුම සංස්ථාව එම විදේශ සැපයුම්කරුවන්ගෙන් ලැබිය යුතු මුදල් අයකර ගැනීමට හෝ පියවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මිලියන 4.392 ක ලැබිය යුතු මුදලින් USD 3.016 ක මුදල M/s Vitol Asia (Pvt) Ltdට අදාළ වන අතර, සැපයුම්කරු 2023/09/30 වන විට ඔවුන්ගේ සියලුම හිඟ මුදල් පියවීමට එකඟ වී ඇත. නියමිත ඉතිරි මුදල පියවීමට අවශ්‍ය විධිවිධාන සළසන ලෙස DGM (C & SC) වෙත ඉල්ලීමක් කර ඇත. | හිඟ ශේෂයන් එකතු කිරීමට හෝ ගෙවිය යුතු මුදල්වලට එරෙහිව පියවීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය |
| (උ) පෙර වසරේදී මා විසින් ඉදිරිපත් කරන ලද වාර්තාවල සඳහන් කර ඇති පරිදි සමාලෝචිත වර්ෂය අවසානයේ වුවද ,විදුලිබල මණ්ඩලය ඇතුළු ප්‍රධාන පාරිභෝගිකයන් සමඟ ඉන්ධන සැපයීම සඳහා විධිමත් ගිවිසුම් වලට එළඹී නොතිබුණි. | විදුලිබල මණ්ඩලය සමග ඉන්ධන සැපයුම් ගිවිසුම (FSA) සකස් කිරීම අවසන් කර ඇතත්, විදුලි බල මණ්ඩලයේ ගෙවීම් සම්බන්ධයෙන් ගෙවීමේ යාන්ත්‍රණයක් සහ ගෙවීමේ සහතිකයක් නොමැතිකම හේතුවෙන් ගිවිසුම අත්සන් කිරීම බලාත්මක නොවීය. | විධිමත් ගිවිසුම්වලට එළඹීමට කඩිනම් පියවර ගත යුතුය |
| **(ඌ) ඉන්ධන තොග විකිණීම හා බෙදා හැරීම.** | | |
| (i) විගණනයේ දී අනාවරනය වූ පරිදි ,බෙදුම්කරුවන් සහ පාරිභෝගිකයන්ගෙන් ඉන්ධන ඇණවුම් භාර ගැනීම , ණය සීමාවන් සහ අදාළ | අලෙවිකරණ කාර්යය/ප්‍රාදේශීය කාර්යාල මගින් SAP හරහා විකුණුම් ඇණවුම් නිර්මාණය කිරීමට කාර්ය මණ්ඩලය පුහුණු | සංස්ථාව තම කාර්යයන් ඉටු කළ යුතුයි |

| | | |
|---|---|---|
| පූර්ව සුදුසුකම් සත්‍යාපනය කිරීම, ඉන්වොයිස් නිකුත් කිරීම,බෙදුම්කරුවන්ගෙන් මුදල් එකතු කිරීම වැනි ඛනිජ තෙල් නිෂ්පාදන සැපයීමට අදාළ බොහෝ ක්‍රියාකරකම් ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම විසින් සිදු කර තිබුණි.නමුත්, එම ක්‍රියාකාරකම් අලෙවිකරණ ආයතනයන් විසින්, විශේෂයෙන්ම සංස්ථාව විසින් සිදු කළ යුතු ක්‍රියාකාරකම් වේ.ඒ අනුව, ඛනිජ තෙල් නිෂ්පාදන ගබඩා කිරීම සහ බෙදාහැරීම සඳහා ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම මඟින් ආවරණය කිරීමට නොහැකි ධාරිතාවයකින් යුත් මෙහෙයුමක නිරත වීමට සංස්ථාව විසින් ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම වෙත ඉඩ ප්‍රස්ථාව ලබා දී තිබුණි.තවද, එවැනි ක්‍රියාකාරකම් ශ්‍රී ලංකා රජය, සංස්ථාව සහ LIOC අතර 2003 දෙසැම්බර් 30 දින ඇති කර ගත් පොදු පරිශීලක පහසුකම් කොටස් හිමියන්ගේ ගිවිසුම (GOSL/CPC/LIOC) මඟින් ආවරණය නොවේ. | කිරීම ආරම්භ කර ඇත. | |
| (ii)ප්‍රමාණවත් ඛනිජ තෙල් නිෂ්පාදන තොග නොමැතිකම හේතුවෙන් ,දිවයින පුරා විසිරී සිටින බෙදුම්කරුවන් හා පාරිභෝගිකයන් ඔස්සේ ඛනිජ තෙල් නිෂ්පාදන බෙදා හැරීම සඳහා ප්‍රමුඛතා ලැයිස්තු සංස්ථාව විසින් ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම වෙත දිනපතා ලබා දී ඇත.2022 ජුනි 07 සිට 18 දක්වා කාලය තුළ සිදු කරන ලද විගණන පරීක්ෂණයට අනුව පහත සඳහන් නිරීක්ෂණ ලැබී ඇත. | -එම- | |
| (iii) සංස්ථාව විසින් සකස් කරනු ලබන ප්‍රමුඛතා ලැයිස්තුව සැලකිල්ලට නොගනිමින් ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ ඇණවුම් කාර්යාංශය (OF) මඟින් බෙදුම්කරුවන් වෙත ඉන්ධන බෙදාහැරීම සඳහා SAP පද්ධතිය තුළින් දෛනිකව පිටතට බෙදාහැරීම් (outbound strip) සකස් කර ඇත.ඒ අනුව, අර්බුධකාරී කාලය තුළ දී සංස්ථාවේ කිසිඳු අධීක්ෂණයකින් තොරව සමාගමේ බෙදාහැරීමේ කාර්යාංශය (DF) විසින් ප්‍රමුඛතා | -එම- | බෙදාහැරීම් විධිමත් ලෙස සිදු කිරීම සහතික කිරීම සඳහා සංස්ථාව විසින් අධීක්ෂණය කළ යුතුය. |

| | | |
|---|---|---|
| ලැයිස්තුවෙන් පිටත ඉන්ධන නිකුත් කර ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය.කෙසේ වෙතත්, ,LIOC උපදෙස්වලට අනුකූලව ඔවුන්ගේ තොග බෙදා හැරීම සිදු කර ඇත | | |
| (iv)පූර්ව අනුමැතියක් ලබා ගැනීමකින් හෝ සංස්ථාව වෙත දැනුම් දීමකින් තොරව ඛනිජ තෙල් නිෂ්පාදන තොග 2509ක් (එක් තොගයකට ලීටර් 6600ක්) සංස්ථාවේ ප්‍රමුඛතා ලැයිස්තුවෙන් බැහැරව බෙදා හැර ඇති බව නිරීක්ෂණය විය.තවද, ප්‍රමුඛතා ලැයිස්තුවට ඇතුළත් ඛනිජ තෙල් නිෂ්පාදන තොග 2524 ක් සංස්ථාවට පිළිගත හැකි සාධාරණ හේතු දැත්වීමකින් තොරව ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම විසින් ගනුදෙනුකරුවන් වෙත ඔවුන්ගේ අභිමතය පරිදි බෙදාහැර නොතිබුණි. | -එම- | -එම- |
| (v)සංස්ථාව මුහුණ දෙන විදේශ විනිමය ගැටළු සම්බන්ධයෙන් යම් සහනයක් ලබා ගැනීම සඳහා ඩොලර් වලින් ගෙවීම් සිදු කරනු ලබන සමාගම් හෝ කර්මාන්ත සඳහා ප්‍රමුඛත්වය ලබා දෙන ලෙසට සංස්ථාව විසින් උපදෙස් ලබා දී තිබුණි.ඒ අනුව ඩොලර් කොන්දේසි මත ගෙවීම් සිදු කිරීමට සූදානම් වූ පාරිභෝගිකයින්ගේ විශේෂ ප්‍රමුඛතා ලැයිස්තුවක් සකස් කර ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම වෙත ලබා දී තිබුණි.නමුත්, ඩොලර් මඟින් ගෙවීම් ලැබී ඇති නමුත් ප්‍රමුඛතා ලැයිස්තුවට අනුව නියමිත දිනට ඔවුන්ගේ ඉන්ධන ලබා නොදුන් අවස්ථා ද වාර්තා වී ඇත. | -එම- | -එම- |
| (vi)විගණනය වෙත ලබා දී ඇති තොරතුරුවලට අනුව, බෙදුම්කරුවන් 1143ක් සංස්ථාවේ ලියාපදිංචි වී ඇත.2022 වර්ෂයේ ජූනි මාසයේ දී සිදු කරන ලද විගණන පරීක්ෂණයකදී නිරීක්ෂණය වූයේ, බෙදුම්කරුවන් 120 දෙනෙකුට කිසිදු පෙට්‍රල් තොගයක් ලබා දී නොමැති බවත්, එක් බෙදුම්කරුවකු සඳහා පෙට්‍රල් තොගය බැගින් (ලීටර් 6600) පමණක් බෙදුම්කරුවන් 22 දෙනෙකුට පෙට්‍රල් ලබා දී ඇති බවත්ය. මේ අතරතුර,එම මාසය තුළ දී එක් බෙදුම්කරුවකුට ලීටර් 210,000කට වඩා වැඩි ප්‍රමාණයකින් බෙදුම්කරුවන් 08 | -එම- | -එම- |

දෙනෙකුට තෙල් ලබා දී ඇත.බෙදුම්කරුවන් 73 දෙනෙකු සඳහා ලංකා ඔටෝ ඩීසල් බෙදා දී නොතිබූ අතර, එක් බෙදුම්කරුවකුට එක් තොගයක් පමණක් වන පරිදි බෙදුම්කරුවන් 08 දෙනෙකුට ලබා දීමට කටයුතු කර තිබුණි.මේ අතරතුර, බෙදුම්කරුවන් 17 දෙනෙකුට එක් අයෙකුට ලංකා ඔටෝ ඩීසල් ලීටර් 200,000කට වැඩි ප්‍රමාණයක් වන පරිදි ලබා දී තිබුණි.තවද,එම කාලය තුළ දී බෙදුම්කරුවන් 66 දෙනෙකුට කිසිදු සුදු තෙල් ආශ්‍රිත නිෂ්පාදනයක් (white oil) ලබා දී නොතිබූ අතර, එක් බෙදුම්කරුවෙකුට එක් තොගයක් පමණක් වන පරිදි බෙදුම්කරුවන් 06 දෙනෙකු සඳහා එම නිෂ්පාදන බෙදා දී ඇත.නමුත් එම මාසය තුළ දී, බෙදුම්කරුවන් 15 දෙනෙකු සඳහා එක් අයෙකුට ලීටර 350,000 ඉක්ම වූ සුදු තෙල් ලබා දීමට කටයුතු කර තිබුණි.ඒ අනුව, රට තුළ අධික පෝලිම් සහ මහජන නොසන්සුන්තා ඇති කිරීමට තුඩු දුන් අර්බුධකාරී කාලසීමාව තුළ ඉන්ධන බෙදාහැරීමේ අසමාන සහ සාධාරණීකරණය කළ නොහැකි රටාවක් ක්‍රියාත්මක වූ බව නිරීක්ෂණය විය.නමුත්, එවැනි ගැටලු වළක්වා ගැනීමට සහ නියමිත වේලාවට නිවැරදි කිරීමට සංස්ථාව විසින් කඩිනම් ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි.

(එ)පෙර විගණන වාර්තා වලින් හෙළි වූ පරිදි ,සංස්ථාව විසින් රු.මිලියන 648ක නිෂ්පාදන බද්දක් ද ඇතුළත් ප්‍රතික්ෂේප කරන ලද නැව්ගත භාණ්ඩ තොගය මුදා හැරීමට පෙර රු.මිලියන 1,617ක් තීරුබදු සහ බදු ගෙවා තිබුණි.කෙසේ වුවද,සංස්ථාව විසින් 2017 ජනවාරි මාසයේ සිට සිදු කරන ලද ගෙවීම් වලින් එම මුදල අය කර ගැනීමට හෝ පියවා ගැනීමට නොහැකි විය.

CPC වෙත ශ්‍රී ලංකා රේගුවෙන් ලැබී ඇති ලිපියෙහි CPC විසින් පසුගිය වර්ෂ සඳහා ගෙවීමට හිග බදු පවතින බවත් එම හිග මුදල් ගෙවනතුරු මෙම මුදල නොපියවන බවත් සඳහන් කර ඇත. තක්සේරු නිවේදනවල ගැටළු හේතුවෙන් CPC හට පෙර බදු මුදල් පියවීමට නොහැකි විය. මේ වන විට ශ්‍රී ලංකා රේගුව මගින් තක්සේරු නිවේදන නිවැරදි කරමින් පවතී.

CPC හි හිඟ බදු ගෙවීම් පියවූ පසු, ශ්‍රී ලංකා රේගුව විගණන විමසුමෙන් එකතු කරන ලද මුදල ගෙවීමට එකඟ විය.

එම මුදල් අයකර ගැනීමට හෝ සමථයකට පත් කිරීමට කටයුතු කළ යුතුයි

| | | |
|---|---|---|
| (ඒ)පෙර විගණන වාර්තා වල සඳහන් කල පරිදි ,ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම විසින් හඳුන්වා දෙන ව්‍යවසාය සම්පත් සැලසුම (ERP) පද්ධතිය සම්බන්ධව සංස්ථාව,CPSTL සහ LIOC සමාගම විසින් එකිනෙකාගේ වගකීම් සම්බන්ධයෙන් කිසිදු ගිවිසුමකට හෝ අවබෝධතා ගිවිසුමකට එළැඹ නොතිබුණි.ඒ අනුව,විශේෂයෙන්ම ඉන්ධන තොග සමාලෝචනය කිරීමේ කටයුතු සහ පිරිපහදු කටයුතු සඳහා සංස්ථාව විසින් එම ERP පද්ධතිය ඵලදායී ලෙස භාවිත කර නොතිබූ බව නිරීක්ෂණය විය. | සටහන් කරන ලදී. | SAP (ERP) පද්ධතිය බහුලව භාවිතා කිරීම සම්බන්ධයෙන් නිසි එකඟතාවයකට එළඹීමට කටයුතු කළ යුතුය. |
| **(ඕ) දැවි තෙල් මිලදී ගැනීම** | | |
| (i) 2012 මාර්තු 14 දිනැති අංක AMA/12/0295/510/003/TBR අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව, සියලුම ඛනිජ තෙල් නිෂ්පාදන ප්‍රසම්පාදනයේදී පසුව පියවීම මත දීර්ඝ කාලයක් සඳහා වාර ගිවිසුම්වලට එළඹීමට සංස්ථාව උත්සාහ කළ යුතුය. එසේ වුවද, 2021 සහ 2022 වර්ෂවල භාවිතා කිරීමට අපේක්ෂිත මුළු දැවී තෙල් ප්‍රමාණය මෙ.ටො 399,979 හෝ මුළු පරිභෝජනයෙන් සියයට 47 ක් සහ මෙ.ටො 547,900 ක් හෝ මුළු පරිභෝජනයෙන් සියයට 53 ක් පිළිවෙළින් නිමි තෙල් ලෙස ආනයනය කිරීමට සැලසුම් කර තිබුණද, 2021 සහ 2022 දී කිසිදු කාලීන ගිවිසුමකට එළඹුණේ නැත. | දැවි තෙල් සඳහා වන වාර ගිවිසුම තොග සමාලෝචන කමිටුව (SRC) විසින් තීරණය කරනු නොලැබේ, මන්ද වර්ෂා තත්ත්වයත් සමඟ ඉන්ධන තෙල් ඉල්ලුම ක්ෂණිකව වෙනස් වේ. තවද පිරිපහදුව මගින් නිපදවන ඉන්ධන ප්‍රමාණයද මෙම ඉන්ධන තෙල් ආනයනයට බලපායි. මෙම හේතූන් නිසා, 2021 සහ 2022 වර්ෂවල ඉන්ධන තෙල් ආනයනය වාර ගිවිසුම් (කාලීන කොන්ත්‍රාත්) යටතේ ක්‍රියාත්මක නොවූ අතර සැලසුම් කළ පරිදි ඉන්ධන තෙල් ආනයනය කිරීමක් සිදු නොවීය. | අමාත්‍ය මණ්ඩල තීරණයේ විධිවිධානවලට අනුකූල වීමට සංස්ථාව උත්සාහ කළ යුතුය. |
| **(ii) හදිසි අවශ්‍යතාවයක් ලෙස පිරිවිතර සංශෝධනය කරමින් දැවී තෙල් මිලදී ගැනීම (BK/48/2022)** | | |
| එම කාලය තුළ PLATTS හි මිල පුරෝකථනයන්ට අනුව, ඛනිජ තෙල්වල ලෝක වෙළෙඳපොළ මිල ක්‍රමානුකූලව පහත වැටීමක් පෙන්නුම් කර ඇත. එසේ තිබියදී, වානිජ කළමනාකරුවන් Laycan දින 21කින් දීර්ඝ කිරීමටත්, 2022 අප්‍රේල් 14-15 සිට 2022 මැයි 8-10 දක්වා Laycan වෙනස් කිරීමටත් එකඟ වූ නමුත්, සංස්ථාවේ සාමාන්‍ය ගෙවීමේ ක්‍රියාපටිපාටියෙන් බැහැරව මූලික Laycan දිනයන් මත පදනම්ව ගෙවීම කර තිබුණි . එබැවින් නිෂ්පාදන මිලදී ගැනීමේ සැබෑ හදිසි අවශ්‍යතාවයක් පැවතියද යන්න ප්‍රශ්නාකාරී වේ. එහි | BK/48/2022 දරණ ටෙන්ඩරය සඳහා 14-15/04/2022 මූලික Laycan දින වලට අදාළව ණයවර ලිපි (L/C) විවෘත කිරීමට සංස්ථාව අපොහොසත් වී ඇත. එකල රටේ පැවති ඩොලර් විනිමය අර්බුදය හේතුවෙන් ශ්‍රී ලංකාවේ රාජ්‍ය බැංකු හරහා L/C නිකුත් කිරීම අපහසු විය. මෙම අවස්ථාවෙහිදී, සැපයුම්කරු නව Laycan ලෙස 8-10/05/2022 යෝජනා කර ඇත. මෙම යෝජනාව 2022/04/26 දින පැවති SRC වෙත ඉදිරිපත් කරන | ඉන්ධන වඩාත් ලාභදායී ආකාරයෙන් ලබා ගැනීමට උත්සාහ කළ යුතුය. |

| | | |
|---|---|---|
| ප්‍රතිඵලයක් වශයෙන්, සංස්ථාවට ඇමෙරිකානු ඩොලර් 970,766 ක හෙවත් රුපියල් මිලියන 355.62 ක ඇස්තමේන්තුගත අතිරේක පිරිවැයක් දැරීමට සිදු ව තිබුණි. | ලද අතර එය SRC විසින් පිළිගනු ලැබූ අතර එය සැපයුම්කරු වෙත දැනුම් දෙන ලදී.<br>මිල වෙනස් වේද යන්න නිශ්චිතව තීරණය කළ නොහැකි අතර, මිල උච්චාවචනයන් පිළිබඳ දිගුකාලීන අනාවැකි සෑම විටම නිවැරදි නොවේ. එබැවින්, එවැනි අවස්ථාවන්හිදී, Laycan දින වෙනස් කිරීම සම්බන්ධයෙන්, සාමාන්‍ය ක්‍රමය වන්නේ මුල් ගිවිසුමට අනුව සැපයුම්කරුට යෝජනා කර ඇති පරිදි මිල නියම කිරීම සඳහා මුල් Laycan දින පවත්වාගෙනයාම වේ. | |
| හදිසි මිලදීගනීමක් ලෙස දැවි තෙල් මිලදී ගැනීමට SRC විසින් තීරණය කර තිබුණද, එහිදී සංස්ථාවේ මූල්‍ය ශක්‍යතාව සැලකිල්ලට ගෙන නොතිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, නෞකාව පැමිණියද නියමිත පරිදි තෙල් ගොඩබෑමට නොහැකිවීම හේතුවෙන් ඇමෙරිකානු ඩොලර් 873,584 ක හෙවත් රු. 336,329,840ක් අතිරේක ඇස්තමේන්තුගත ප්‍රමාද ගාස්තුවක් දැරීමට සිදුව තිබුණි<br>**(iii) පිරිවිතරයන්ට අනුකූල නොවීම හේතුවෙන් සංස්ථාව විසින් SSCAPC අනුමැතිය ඇති දැවි තෙල් (BK/11/2021) ප්‍රසම්පාදනයට අදාළ ලංසුවක් ප්‍රතික්ෂේප කර වෙනම ලංසු දෙකක් (BK/13/2021) සහ (BK/16/2021) ලෙස නැවත කැඳවා ඇත.**<br>මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කෙරේ. | එවකට රට තුළ පැවති මූල්‍ය අර්බුදය හේතුවෙන් L/C විවෘත කිරීමට හෝ අත්තිකාරම් ගෙවීමට නොහැකිව මෙම නැව්ගත කිරීම කොළඹ ගොඩබෑමේ වරායේ නැංගුරම් ලා තැබීමට සිදු විය. | -එම- |
| අනනුකූල බවට තීරණය කර ඇති පිරිවිතර වෙනස් නොකර සංස්ථාව විසින් ලංසු දෙකක් නැවත කැඳවා තිබූ අතර Laycan දින පමණක් වෙනස් කර ඇති බව නිරීක්ෂණය විය. ස්ථාවර ඇගයීම් කමිටුවේ (STEC) නිර්දේශය සහ පිරිවිතරයන්ට අනුකූල නොවී ස්ථාවර අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ප්‍රසම්පාදන කමිටුවේ (SSCAPC) අනුමැතිය ඇතිව කලින් ප්‍රතික්ෂේප කරන ලද එම සැපයුම්කරුගෙන්ම ටෙන්ඩරය ප්‍රදානය කර ප්‍රසම්පාදනය කර | BK/13/2022 යටතේ දැවි තෙල් නැව ගෙන ඒමේ ප්‍රධාන අරමුණ වූයේ ,ඒ වන විට වෙස්ට් කෝස්ට් පවර් බලාගාරය . (WCPP) විසින් කරන ලද ඉන්ධන ඉල්ලුමට අනුව රට තුළ විදුලිය නිපදවීමට අවශ්‍ය ඉන්ධන තෙල් තොග සීමා වී තිබීමයි.<br><br>මේ හේතුවෙන් MS Vitol Asia Pte (Ltd ) s 'pore වෙත පිරිනමන ලද BK /13/2021 නැවත සලක | -එම- |

| | | |
|---|---|---|
| ඇත. කෙසේ වෙතත්, නව ලංසුවට අනුව, මුල් ලංසුව (BK/11/2021) අනුව ඉදිරිපත් කළ මිලට සාපේක්ෂව ඉහළ මිල වාරිකයක් ලබා දී ඇත. ඒ අනුව, නැවත ලංසු තැබීමේ දී ඉහළ වාරිකයක් උපුටා දැක්වීම හේතුවෙන්, සංස්ථාවට ඩොලර් 390,238 ක වළක්වා ගත හැකි අතිරේක පිරිවැයක් රු. මිලියන 76.73 කි. | බැලීම සඳහා.2021.06.01 වන දින WCPP වෙත යොමු කරන ලදී.එහිදී ඔවුන් මෙම පිරිවිතර මෙම අවස්ථාවට පමණක් අනුමත කරන තීරණය කර ඇත.ඒ අනුව ටෙන්ඩරය STEC හා SSCAPC අනුමැතිය සහිතව MS Vitol Asia Pte (Ltd ) s 'pore වෙත පිරිනමන ලදී. | |
| එම කාලය තුළ PLATTS හි මිල පුරෝකථනයන්ට අනුව, ඛනිජ තෙල් නිෂ්පාදනවල ලෝක වෙළඳපල මිල ක්‍රමයෙන් ඉහළ යාමේ ප්‍රවණතාවක් පෙන්නුම් කර ඇත. ඒ අනුව, සාධාරණ පුරෝකථනයක් සිදු නොකළ අවස්ථාවක හා මිල ඉහළ යාමේ හැකියාවක් පවතින අවස්ථාවක Laycan වෙනස් කිරීම හා නව Leycan යටතේ මිලදී ගැනීම හේතුවෙන් සංස්ථාවට රුපියල් මිලියන 72.52 ට සමාන ඇමෙරිකානු ඩොලර් 368,837 ක ඇස්තමේන්තුගත පාඩුව වළක්වා ගත හැකිව තිබූ බව නිරීක්ෂණය වේ. | ලෝක තෙල් මිල උච්චාවචනය පිළිබඳ දිගුකාලීන අනාවැකි ප්‍රායෝගික නොවන අතර එම අනාවැකි සෑම විටම නිවැරදි නොවේ. මෙම මිල උච්චාවචනයන් සම්බන්ධයෙන් තීරණ ගැනීම ප්‍රායෝගික නොවන අතර සංස්ථාව සෑම විටම උත්සාහ කරන්නේ ඉතා අඩු පිරිවැයක් යොදමින් රටේ ඛනිජ තෙල් අවශ්‍යතාවය නියම වේලාවට සපුරාලීමටයි. තවද SRC විසින් සියලුම ටෙන්ඩර් කැඳවනු ලැබුවේ එහි ඒකමතික තීරණ මතය.එම තීරණවලට තුඩු දුන් ප්‍රායෝගික සාධාරණීකරණයන් අදාළ SRC වාර්තාවල පැහැදිලිව සඳහන් කර ඇත. SRC සතියකට වරක් රැස්වීමට ප්‍රධාන හේතුව රට තුළ අඛණ්ඩ තෙල් සැපයුමක් පවත්වා ගැනීමයි. | -එම- |
| **(ඔ) ඩීසල් මිලදී ගැනීම** | | |
| **වාර ගිවිසුම් අවලංගු කර සැපයුම්කරු සිය කැමැත්තෙන් දෙනු ලබන යෝජනා ක්‍රමය යටතේ ඩීසල් මිලදී ගැනීම**<br>2022 වර්ෂයේ මාර්තු 01 සිට ඔක්තෝම්බර් 31 දක්වා, බැරලයකට ඇ.ඩො 7.48 ක මිල වාරිකයක් යටතේ ඩීසල් (LAD) බැරල් 1,960,000 ක් මිලදී ගැනීම සඳහා එළැඹ තිබූ වාර ගිවිසුම, පෙර ගෙවීමේ ක්‍රමයට බැරලයකට ඇ. ඩො 6.98 ක මිල වාරිකයක් යටතේ සක්‍රියව පවත්වාගැනීමට සැපයුම්කරු ලබා දී තිබූ විකල්ප අවස්ථාවද ප්‍රතික්ෂේප කරමින් අහෝසි වී තිබුණි. | එකල රටේ පැවති විනිමය අර්බුදය නිසා මෙම වාර ගිවිසුම සක්‍රියව පවත්වාගෙන යාමට හැකියාවක් නොමැත.<br>වාර්තාවේ දක්වා ඇති පරිදි, වාර කොන්ත්‍රාත්තුව බැරලයක් සඳහා ඩොලර් 6.98 ක මිලකට ක්‍රියාත්මක කිරීමට හැකියාව තිබුණද, මෙම වාර කොන්ත්‍රාත්තුව සඳහා කැබිනට් අනුමැතිය ලබා දී ඇත්තේ L/C නිකුත් කිරීමට යටත්ව බැරලයක ඩොලර් 7.48 ක මිල වරිකයකට දින 180 ක ණය කාලයක් සඳහා ය. | -එම- |

| | | |
|---|---|---|
| කෙසේ වෙතත්, වාර ගිවිසුම සක්‍රීය කාලසීමාව තුළ සංස්ථාව විසින් ඩීසල් බැරල් 497,996 ක් ලබාගෙන ඇති අතර එය පිළිවෙලින් බැරල් 274,185 ක් සහ 223,811 ක් බැරල් එකක් සඳහා ඇමෙරිකානු ඩොලර් 24 සහ ඇමෙරිකානු ඩොලර් 23 ක මිළ වාරික යටතේ එම අවස්ථා 02 කදී පෙරගෙවුම් පදනම මත වාර ගිවිසුම තිබූ සැපයුම්කරුගෙන්ම මිලදී ගෙන ඇත . එම නිසා සංස්ථාවට රු. මිලියන 3,047.42 හෙවත් ඇමෙරිකානු ඩොලර් 8,252,081 අතිරේක පිරිවැයක් දැරීමට සිදුව තිබුණි | පෙර ගෙවීමේ පදනම මත බැරලයක් ඩොලර් 6.98 ක මිලකට සැපයුම්කරුගේ දෙවන යෝජනාව ක්‍රියාත්මක කිරීමට සංස්ථා නිලධාරීන්ට නොහැකි විය. ඉන්දියානු කෙටි කාලීන ණය යෝජනා ක්‍රමය යටතේ සියලුම ඩීසල් නැව් 2022 මැයි මාසයේදී ලබා දෙන ලදී.<br><br>BK/139/2022 හා BK/168/2022 ඇණවුම් අංක යටතේ නැව් දෙකක් ජූලි මාසයේදී සහ අගෝස්තු මාසයේදී ඉන්ධන අවශ්‍යතාවය මත රටේ දැඩි බව සහ රටේ ආර්ථික ස්ථාවරත්වය යම් ප්‍රමාණයකට පවත්වා ගැනීම සඳහා ලබා ගන්නා ලදී. අවශ්‍ය නිශ්චිත අනුමැතිය අනුගමනය කරමින් සිය කැමැත්තෙන් ලබාදුන් යෝජනාවක් යටතේ මෙම ඇණවුම් දෙක M/s Coral Energy DMCC, UAE. සැපයුම්කරුගෙන් CPC හි අනුමැතිය ඇතිව STEC නිර්දේශ අනුව SSCAPC හි අනුමැතිය මත ලබාගෙන ඇත. | -එම- |
| සංස්ථාව විසින් ලංකා ඔටෝ ඩීසල් (LAD) බැරල් 922,381 ක් බැරලයක් සඳහා පිළිවෙළින් ඇමෙරිකානු ඩොලර් 17.00, ඇමෙරිකානු ඩොලර් 19.87 සහ ඇමෙරිකානු ඩොලර් 13.83 බැගින් මිල වාරිකයකට අදාළ වාර ගිවිසුම සක්‍රීය කාලසීමාව තුළ වෙනත් සැපයුම්කරුවන් දෙදෙනෙකුගෙන් අවස්ථා 03 කදී මිලදී ගෙන ඇත.. ඒ අනුව, සංස්ථාව විසින් රු. මිලියන 3,381.69 හෙවත් ඇමරිකානු ඩොලර් 9.146,741. ක අතිරේක පිරිවැයක් දැරීමට සිදුව තිබුණි | රටේ පවතින දැඩි බව ඉන්ධන අවශ්‍යතාවය මත සහ රටේ ආර්ථික ස්ථාවරත්වය යම් ප්‍රමාණයකට පවත්වාගෙන යාමේ අරමුණින් මෙම මිලදී ගැනීම් සිදුකර ඇත. තවද මෙම ඇණවුම් සිය කැමැත්තෙන් ලබාදුන් යෝජනාවක් මත ඉහළ කළමනාකාරිත්වයේ අනුමැතිය,STEC නිර්දේශයන්ට අනුව SSCAPC අනුමැතිය මත සැපයුම්කරු වෙත මෙම නොකැඳවූ යෝජනාව ප්‍රදානය කර නිශ්චිත ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටිය අනුගමනය කරමින් ලබාගෙන ඇත. | -එම- |
| **(ii) වෙනස් PLATTS අගයන් මත මිල කිරීම හේතුවෙන් අතිරේක ගෙවීම්** | | |
| සංස්ථාව විසින් ආනයනය කරන ලද ඛනිජ තෙල් නිෂ්පාදන වල මිල තීරණය කරනු ලබන්නේ සිංගප්පූරු වෙළඳ | Platt's Gas Oil 10 ppm මිල දර්ශකය මත පදනම්ව සිය කැමැත්තෙන් ලබාදුන් | -එම- |

පොළ (PLATTS )විසින් ප්‍රකාශයට පත් කරනු ලබන මිල දර්ශක පදනම් කර ගැනීම මගිනි.

සමාලෝචිත වර්ෂය තුල සැපයුම්කරුවන් 04 දෙනෙකුගෙන් අවස්ථා 08 දී ලංකා ඔටෝ ඩීසල් LAD (Gas Oil 500 ppm) බැරල් 1,820,012 ක් ඇණවුම් කර තිබුණද, මිල කිරීම සඳහා Gas Oil 500 ppm වෙනුවට PLATTS හි සාපේක්ෂව වැඩි සාමාන්‍ය අගයක් සහිත ලංකා සුපර් ඩීසල් (LSD) මිල හෙවත් Gas Oil 10ppm හි FOB Singapore Price Method පදනම් කර ගැනීම හේතුකොටගෙන සංස්ථාවට එකතුව ඇ.ඩො 10,499,898 ක් හෙවත්. රු මිලියන 3,872.96 ක වැඩිපුර පිරිවැයක් දැරීමට සිදුවී තිබුණි.

යෝජනාවක් සඳහා සැපයුම්කරු LAD (ගෑස් තෙල් 500 ppm) මිල ඉදිරිපත් කර ඇත. එම අවස්ථා වලදී STEC සහ SSCAPC නිර්දේශය වූයේ මෙම LSD (ගෑස් ඔයිල් 10 ppm) පිරිවිතරයෙන් බැහැර වී අදාළ Platt's හි LAD (ගෑස් තෙල් 5 0 0 ppm) භාවිතා කර පිරිවිතරයට එකඟ වන ලෙස සැපයුම්කරුගෙන් ඉල්ලා සිටීමයි.

එවැනි ඉල්ලීමක් කළ නමුත් සැපයුම්කරු ඊට එකඟ වී නැත. එසේම වෙනත් තරගකාරී විකල්ප යෝජනා මේ වන විට ලැබී නොමැත.

මෙම පිරිවිතරයන් (ගෑස් ඔයිල් 10 ppm) සහිත LAD (ගෑස් ඔයිල් 5 0 0 ppm) මිලදී ගැනීම සම්බන්ධයෙන් CPC කළමනාකාරිත්වය විසින් කමිටුවක් පත් කරන ලදී.

**(iii) ඉන්දියානු කෙටිකාලීන ණය පහසුකම යටතේ ඩීසල් මිලදී ගැනීම (Indian Credit Line)**

ඉන්දියානු කෙටිකාලීන ණය පහසුකම යටතේ සංස්ථව විසින් අවස්ථා දෙකකදී ලංකා ඔටෝ ඩීසල් LAD (Gas Oil 500 ppm) බැරල් 599,722 ක් ඇණවුම් කර තිබුණද, ඒ සඳහා මිල කිරීම සඳහා PLAATS හි සාපේක්ෂව වැඩි සාමාන්‍ය අගයක් සහිත ලංකා සුපර් ඩීසල් LSD (Gas Oil 10ppm) වලට අදාල FOB Singapore Price Method යොදාගැනීම හේතුවෙන් සංස්ථාවට එකතුව ඇ.ඩො. 4,582,179 හෙවත් රු. මිලියන 1,669.54 ක වැඩිපුර පිරිවැයක් දැරීමට සිදුවී තිබුණි.

මිලියන 200ක ඉන්දියානු ණය ආධාර මුදලට යටත්ව, IOC, India (Indian Oil Corporation, India) සැපයුම්කරු විසින් මෙම ඇණවුම් යෝජනාව ඉදිරිපත් කර ඇත. එහිදී සැපයුම්කරු විසින් Platt's Gas Oil 10 ppm මිල දර්ශකය මත පදනම්ව LAD (ගෑස් තෙල් 500 ppm) සැපයුම සඳහා මිල සඳහන් කර ඇත. CPC LAD 500ppm මිල දර්ශකය සමඟ එකඟ වන ලෙස ඉල්ලා ඇති නමුත් සැපයුම්කරු එකඟ වී නැත. මෙම කාල සීමාව තුළ රට තුළ පැවති දැඩි විනිමය අර්බුදය හේතුවෙන් STEC සහ SSCAPC නිර්දේශය වූයේ මෙම LAD (Gas Oil 500 ppm) මිල දර්ශකයෙන් බැහැරව LSD (Gas Oil 10 ppm) අදාළ Platt's භාවිතා කිරීමයි. එසේම තරගකාරී වෙනත් විකල්ප

-එම-

| | | |
|---|---|---|
| | යෝජනා මෙම කාලය තුල ලැබී නොතිබුණි . | |
| **(ඖ) බොර තෙල් මිලදී ගැනීම**<br>2022 වර්ෂයේදී ආනයනය කරන ලද Siberian Light සහ Ural බොරතෙල් බැරල් 2,023,509 කට අදාලව ගෙවීම් කිරීමේදී මිල තීරණය කිරීම සඳහා PLAATS හි සාපේක්ෂව වැඩි සාමාන්ය අගයක් සහිත Dated Brent මිල දර්ශකය සමාලෝචිත වර්ෂයේ දී අවස්ථා 03 කදී යොදාගැනීම හේතුවෙන්, ඒ ඒ නිෂ්පාදන වලට අදාලව Singapore PLATTS හි දෛනිකව ප්රසිද්ධ කරනු ලබන මිල දර්ශකයට අනුව ගණනය කරන ලද මිලට (පිරිවැයට) සාපේක්ෂව, සංස්ථාව විසින් ඇ. ඩො. මිලියන 48.603,7 ක් හෙවත් රු. මිලියන 17,877 ක් අතිරේක පිරිවැයක් දැරීමට සිදුවී තිබුණි. | CR/15/2022 සහ CR/38/2022 අංක යටතේ ඇණවුම් දෙකක් සැපයුම්කරු විසින් ඉදිරිපත් කරන ලද මිල දර්ශක මත පදනම්ව STEC නිර්දේශ සහ SSCAPC හි අනුමැතිය සමඟ සිය කැමැත්තෙන් ලබාදුන් යෝජනා හරහා මිලදී ගන්නා ලදී ලියාපදිංචි සැපයුම්කරුවන් කිසිවකු ටෙන්ඩර් සඳහා ලංසු ඉදිරිපත් නොකළ නිසාත්, මෙම කාලය තුළ බොරතෙල් මිලදී ගැනීමට වෙනත් විකල්ප මාර්ගයක් නොතිබූ නිසාත්, බොරතෙල් තොග දෙකක් මිලදී ගැනීමට සිදු විය. එමෙන්ම බොරතෙල් නැව්දෙකක මිලදී නොගත්තේ නම් පිරිපහදුවෙන් රටේ බලශක්ති අවශ්යතා සපුරාලීමට නොහැකි වීම නිසා රටම අර්බුදයකට ලක්වීමට ඉඩ තිබුණි | -එම- |
| **(ක) නැව් ප්‍රමාද ගාස්තු (Demurrage)**<br>සංස්ථාවේ වාර්තාවලට අනුව, නිමි ඛනිජ තෙල් නිෂ්පාදන සඳහා පසුගිය වර්ෂයේදී මෙ.ටො. 40,000 ක තෙල් පටවනලද නැවකට පැවති ඇ.ඩො. 15,000 - 21,500 අතර පැවති සාමාන්‍ය දෛනික ප්‍රමාද ගාස්තු රේටය 2022 වර්ෂයේදී ඇ.ඩො. 16,000 - 55,000 දක්වා වැඩිවී තිබුණි.. තවද පසුගිය වර්ෂයේදී බොර තෙල් නැවකට පැවති .ඇ .ඩො 4000-17500ක් වූ දෛනික ප්‍රමාද ගස්තු රේටය ,සමාලෝචිත වර්ෂයේදී ඇ ඩො 45000-120000ක් දක්වා වැඩි වී තිබුණි. ඒ අනුව, සමාලෝචිත වර්ෂය තුළ සැපයුම්කරුවන් විසින් ඉල්ලා සිටි නැව් ප්‍රමාද ගාස්තු ප්‍රමාණය රු. මිලියන 572 සිට රුපියල් මිලියන 5,463 දක්වා හෝ පෙර වසරට සාපේක්ෂව 9 ගුණයකින් වැඩි විය. | 2021 හා සසඳන විට 2022 දී නැව් ප්‍රමාද ගාස්තු ඉහළ යාමට හේතු වූයේ මෙම කාල සීමාවන් තුළ රට තුළ ඇති වූ දැඩි මූල්‍ය අර්බුදයයි. මෙම තත්ත්වය හේතුවෙන් සැපයුම්කරු සමඟ එකඟ වූ පරිදි නියමිත වේලාවට ඇණවුම් කරන ලද තෙල් තොග සඳහා L/C විවෘත කිරීම CPC හට ඉතා අපහසු විය. සමහර විට එකඟ වූ පරිදි L/C හෝ අත්තිකාරම් ගෙවීම ලබා දෙන තුරු තෙල් නැව් දින කිහිපයක් ගොඩබෑමේ වරායේ නැංගුරම් ලා තිබුණි. මෙම තත්ත්වය මත පදනම්ව, සැපයුම්කරුවන් විසින් අදාළ නැව් සඳහා අයකරනු ලබන ප්‍රමාද ගාස්තු අනුපාතය වැඩි කර ඇත.<br>ටෙන්ඩරයේ සඳහන් ගොඩබෑමේ | -එම- |

වරායේ දැඩි යාත්‍රා කොන්දේසි හේතුවෙන් සැපයුම්කරුවන් විසින් යෝජනා කරන ලද නැව්වල ප්‍රමාද ගාස්තු රේටය ඉහළ මට්ටමක පවතින නමුත් එම නැව් තෙල් තොග ආනයනය සඳහා භාවිතා කළ යුතුය. එම කොන්දේසි සපුරාලිය හැකි නැව් වෙළඳපොලේපවතිනුයේ ඉතා සීමිත ප්‍රමාණයකි.

**(ග)ඉන්දියානු ණය පහසුකමේ ණය ආපසු ගෙවීම**

2022 පෙබරවාරි 02 දින, ශ්‍රී ලංකා රජය වෙනුවෙන් මහා භාණ්ඩාගාරයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව සහ ඉන්දීය රජය වෙනුවෙන් ඉන්දියානු අපනයන හා ආනයන බැංකුව (EXIM බැංකුව) අතර කෙටි කාලයක් ලබා ගැනීම සඳහා ගිවිසුමක් අත්සන් කරන ලදී. - ශ්‍රී ලංකාව සඳහා ඛනිජ තෙල් නිෂ්පාදන මිලදී ගැනීම සඳහා ඇමරිකානු ඩොලර් මිලියන 500 ක කාලීන ණය පහසුකම. ලබාදීම සඳහා ගිවිසුම් අත්සන් කරන ලදී . තවද, ඛනිජ තෙල් නිෂ්පාදන මිලදී ගැනීම සඳහා රජය විසින් ලබාගත් වෙනත් ණය පහසුකමකින් ඇමෙරිකානු ඩොලර් මිලියන 200 ක මුදලක් ලබා දී තිබුණි. ඒ අනුව, සංස්ථාව සහ රජය 2022 අප්‍රේල් 28 වන දින, භාවිතා කිරීමේ නියමයන් සහ කොන්දේසි සහ ණය ආපසු ගෙවීම සම්බන්ධයෙන් ණය දීමේ ගිවිසුම් දෙකකට අත්සන් කර ඇත. එම ගිවිසුම්වල 2.03 වගන්තියට අනුව, ණය පහසුකම් ගිවිසුමට අනුව ආනයනය කරන ලද එක් එක් තොගයක් සඳහා ඩොලර් වලට සමාන වන මූලික ණය මුදල ශ්‍රී ලංකා රුපියල් වලින් ආනයන නිෂ්කාශන ලේඛන ආනයනකරු/CPC බැංකුව වෙත ලැබුණු දිනයේ සිට මාස හයක් ඇතුළත සංස්ථාව විසින් රජයට (මුදල් අමාත්‍යාංශයේ භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට) ආපසු ගෙවිය යුතුය.. කෙසේ වෙතත්, සංස්ථාව

පිරිවැය පදනම්ව මිලකරණ යාන්ත්‍රණයක් නොමැති වීම සහ ඇමරිකානු ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල් හි දැඩි අවප්‍රමාණය වීම හේතුවෙන් CPC හි මූල්‍ය තත්ත්වය දැඩි ලෙස බලපෑවේය. මෙමගින් 2022 වසරේදී රුපියල් බිලියන 615 ක පාඩුවක් සිදුවී ඇත.

එබැවින්, ජාතියට ඉන්ධන සැපයීම සමගාමීව අඛණ්ඩව සිදු කරන බවට සහතික වෙමින් ඉහත ණය පියවීමට CPC හට හැකියාවක් නොතිබුණි. මෙම ස්ථාවරය විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයට සහ මුදල් අමාත්‍යාංශයට දිගින් දිගටම දැනුම් දෙන ලදී.

2023/07/05 දිනැති අංක 23/1200/604/118 දරන තෝරාගත් රාජ්‍ය ව්‍යවසායන්ගේ ශේෂ පත්‍රයන් ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා වන අමාත්‍ය මණ්ඩල තීරණය යටතේ ලංවිම සහ ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් වෙතින් CPC වෙත ලැබිය යුතු ශේෂ සමඟ ඉහත ඇමෙරිකානු ඩොලර් 697 ක් වූ ණය ශේෂය හිලව් කිරීමට මුදල් අමාත්‍යාංශය දැනටමත් කටයුතු කර ඇත.

අමාත්‍ය මණ්ඩල අනුමැතිය හා ගිවිසුම් ප්‍රකාරව ගෙවියයුතු ශේෂ නිරවුල් කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුය

විසින් සමාලෝචිත වර්ෂය අවසානයේ දී නියමිත කාල සීමාව ඉක්මවා තිබියදීත්, රුපියල් මිලියන 228,770 ක් හිඟ මුදල පියවා නොතිබුණි.

### 3.2. මෙහෙයුම් අකාර්යක්ෂමතාව

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ). 2013 වර්ෂයේදී සංස්ථාව විසින් ඛනිජ තෙල් නිෂ්පාදන මිලදී ගැනීම සම්බන්ධයෙන් ටෙහෙරානයේ ජාතික ඉරාන සංස්ථාවට රුපියල් මිලියන 32,344ක් එනම් ඇමෙරිකානු ඩොලර් 250,925,169 ක සමුච්චිත මුදලක්, ගෙවීමට සිදු විය. කෙසේ වෙතත්, ඇමරිකා එක්සත් ජනපදය විසින් ඉරානයට පනවා ඇති සම්බාධකවලට අනුකූලව, ඉහත සඳහන් හිඟ ශේෂය නිරවුල් නොවීය. මෙම හිඟ ශේෂය සෑම වසරකම අවසානයේදී ආරම්භයේ සිට ගෙවිය යුතු මුදලක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල පෙන්වා ඇති අතර, විනිමය ලාභය හෝ අලාභය අදාළ වර්ෂයේ ගිණුම්ගත කර තිබුණි. ඒ අනුව, සමාලෝචිත වර්ෂය අවසානයේ දී ගෙවිය යුතු ශේෂය සහ සමුච්චිත විනිමය අනුපාත විචල්‍යතා අලාභ පිළිවෙලින් (2013 සිට 2022 දක්වා) රු. මිලියන 93,246 ක් සහ රු. පිළිවෙලින් මිලියන 61,838 දක්වා වැඩි වී තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා විනිමය අලාභය රු. මිලියන 42,308 කි. පාලනය කළ නොහැකි බාහිර සාධක හේතුවෙන් ඒ සඳහා කිසිදු ගෙවීමක් සිදු කර නොමැති බව වැඩිදුරටත් නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, ඇමෙරිකානු ඩොලර් වලට වඩා ශ්‍රී ලංකා රුපියල් ක්‍රමයෙන් අවප්‍රමාණය වන තත්වයක් තුළ එම මුදල විකල්ප ආකාරවලින් පියවීමට සංස්ථාව අසමත් විය. | ශ්‍රී ලංකාවේ ඩොලර් මිලියන 250.0 ක තෙල් ණය පියවීමට සඳහා තේ හුවමාරු වෙනුවට ,ඉරානය හා ශ්‍රී ලංකාව අතර අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුම ක්‍රියාත්මක කිරීමට මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, විදුලිබල අමාත්‍යාංශය, ශ්‍රී ලංකා තේ මණ්ඩලය, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය, විදේශ කටයුතු අමාත්‍යාංශය යන ආයතනවල සහභාගිත්වයෙන් සාකච්ඡා කර ඇත. ඉහත සාකච්ඡාවල ප්‍රතිඵල මත හිඟ මුදල් පියවනු ඇත. | මේ සම්බන්ධයෙන් වන පිරිවැය සහ අනෙකුත් ප්‍රතිවිපාක අවම කර ගැනීමට සංස්ථාව විසින් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |

**(ආ) ඛනිජ තෙල් නිෂ්පාදන ගබඩා කිරීම සහ බෙදා හැරීම**

ඛනිජ තෙල් ගබඩා සංකීර්ණය සුමටව සහ ආරක්ෂිතව ක්‍රියාත්මක කිරීම සඳහා නිර්දේශ සහිතව ශ්‍රී ලංකාවේ දැනට භාවිතා කරනු ලබන ඛනිජ තෙල් ගබඩා ධාරිතාව සහ දැනට ක්‍රියාත්මක වන දුම්රිය සහ බවුසර් ප්‍රවාහන පද්ධතිය ඇතුළු ඉන්ධන ප්‍රවාහන නළ පද්ධතියේ යෝග්‍යතාවය සහ ඵලදායීතාවය පිළිබඳව විශේෂ විගණන වාර්තාවක් පාර්ලිමේන්තුවේ සභාගත කරන ලදී. ඛණිජ තෙල් ගබඩා සංකීර්ණය සහ ඉන්ධන ප්‍රවාහන ක්‍රියාවලිය සුමටව හා ආරක්ෂිතව ක්‍රියාත්මක කිරීම සඳහා විධිමත් අභ්‍යන්තර පාලන පද්ධතියක් සංස්ථාව විසින් නිසි පරිදි සැලසුම් කර ක්‍රියාත්මක කර නොතිබූ බව මෙම විගණන වාර්තාවෙන් අවධාරණය කර ඇත. කෙසේ වෙතත්, ඛනිජ තෙල් ගබඩා සංකීර්ණය සුමටව සහ ආරක්ෂිතව ක්‍රියාත්මක කිරීම සඳහා එම වාර්තාවේ දක්වා ඇති නිර්දේශ ක්‍රියාත්මක කිරීමට සංස්ථාව සාධාරණ ලෙස උත්සාහ කර තිබේද යන්න විගණනයට තහවුරු කර ගැනීමට නොහැකි විය.

අන්තර්ගතයට එකඟයි.

සංස්ථාව විසින් වාර්තාවේ නිර්දේශයන් නිසි ලෙස ඇගයීමට ලක් කර සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය.

රටේ ඛනිජ තෙල් ගබඩා සංකීර්ණය සහ ඉන්ධන ප්‍රවාහන පද්ධති සුමටව හා ආරක්ෂිතව ක්‍රියාත්මක කිරීමට පියවර ගත යුතුයි.

**(ඇ)ත්‍රිකුණාමල තෙල් ටැංකි සංකීර්ණය**

ඝන මීටර් 12,500 (m3) (10,000 MT) ධාරිතාවයකින් යුත් තෙල් ටැංකි 100 කින් සහ අනෙකුත් ආශ්‍රිත පහසුකම් සමන්විත ටැංකි සංකීර්ණය 1930 දී ත්‍රිකුණාමලයේ ඉදිකරන ලදී. හෙක්ටයාර් 358.553 ක භූමි ප්‍රමාණයකින් යුත් තෙල් ටැංකි සංකීර්ණයට අයත් විය. ශ්‍රී ලංකාවට නිදහස ලැබීමට පෙර වසර 999 ක කාලයක් සඳහා ශ්‍රී ලංකා රජය විසින් බ්‍රිතාන්‍ය රජයේ ඉහළ අද්මිරාල් සාමිවරයාගේ කොමසාරිස්වරුන් වෙත බදු පදනම මත ලබා දී ඇත. 1961 දී ශ්‍රී ලංකා

ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සභාපතිවරයාගේ නියෝගය මත ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ නිලධාරීන් කණ්ඩායමක් ටැංකි සහ ඒ ආශ්‍රිත යටිතල පහසුකම් සහ නල පද්ධති පිළිබඳ තත්ත්ව තක්සේරුවක් සිදු කර ව්‍යාපාර ආකෘතියක් 2016 වසරේ යෝජනා කරන ලදී. එම ටැංකි සම්බන්ධයෙන් පැවති භූ දේශපාලනික ගැටලු හේතුවෙන් සංවර්ධනය කිරීම සිදු කිරීම සඳහා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට කිසිදු පාර්ශවයක්

චීන වරාය තෙල් ටැංකි සංකීර්ණය සංවර්ධනය කිරීම සඳහා ව්‍යාපාර කරගෙන යාමට යෝග්‍ය වන පරිදි විධිමත් උපාය මාර්ගික සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කිරීමට කඩිනම් අවධානය යොමු කළ යුතුය.

රජයේ ඉල්ලීම පරිදි සංස්ථාව විසින් ස්ටර්ලින් පවුම් 250,000 ක් ගෙවන ලදුව වාරික තුනකින් ගෙවා 1964 අප්‍රේල් 01 දින සිට බලපැවැත්වෙන පරිදි ඉඩම්, ටැංකි සංකීර්ණය, ගොඩනැගිලි සහ අනෙකුත් උපකරණ සංස්ථාව සන්තකයේ තබාගෙන ඇත. එසේ වුවද,.ඉහත ඉඩම සඳහා රජයෙන් නීතිමය ලියවිලි කිසිවක් මේ දක්වා ලබාගෙන නැත.

2003 වර්ෂයේදී ශ්‍රී ලංකා රජය LIOC සහ සංස්ථාව සමඟ ගබඩා පහසුකම් සහ ඉඩම LIOC සමාගමට වසර 35කට බදු දීම සඳහා ගිවිසුමකට එළඹී ඇති අතර ගිවිසුම මාස 6ක් ඇතුළත ක්‍රියාත්මක කළ යුතුව තිබුණි. කෙසේ වෙතත්, සංස්ථාව කිසිදු බදු ගිවිසුමකට එළැඹී නොතිබූ අතර, තවමත් ටැංකි භාවිතා කර නැත. එසේ වුවද, 2003 වසරේ සිට LIOC එම වත්කම් භාවිත කරමින් සිට ඇත. අතහැර දමා ඇති ඉහළ කොටසේ ටැංකි 84 නවීකරණය සඳහා මූලික තීරණ ගැනීමේ කටයුතු 2015 අප්‍රේල් 29 වන දින ආරම්භ කර තිබුණද, ටැංකි සංකීර්ණයේ සංවර්ධනය හා ප්‍රතිසංස්කරණය තවමත් සිදු කර නොතිබුණි.

ත්‍රිකුණාමලය තෙල් ටැංකි සංකීර්ණය සංවර්ධනය කිරීමට සඳහා වන ගිවිසුමකට අදාළව සංස්ථාව සහ LIOC එක්ව ට්‍රින්කෝ පෙට්‍රෝලියම් ටර්මිනල් (පීටීවී) එල්ටීඩී (TPTL) නමින් ඒකාබද්ධ සමාගමක් ස්ථාපිත කර තිබුණද අදාළ ව්‍යාපාර කරගෙන යාමට යෝග්‍ය පරිධි ,චීන වරාය තෙල් ටැංකි සංකීර්ණය අදාළ ව්‍යාපාර කරගෙන යාමට හා සංවර්ධනය කිරීම සඳහා නිසි උපායමාර්ගික සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කර නොතිබුණි. .

විසින් ඉඩ ලබා දී නොතිබුණි

මෙම පසුබිම තුළ, 2020 වර්ෂයේදී, CPC විසින් උතුරු හා නැගෙනහිර පළාත්වල දේශීය භාවිතයට අවශ්‍ය ඛනිජ තෙල් නිෂ්පාදන ගබඩා කිරීම සඳහා ඉහළ ටැංකි සංකීර්ණයහි ගබඩා ටැංකි24 ප්‍රතිසංස්කරණය කිරීම සඳහා පුළුල් සංවර්ධන සැලැස්මක් නැවත සකස් කරන ලදී. එමගින් සැලකිය යුතු පිරිවැය අඩුවීමක් ලග කර ගැනීමට හැකිවනු ඇත, මේ සඳහා පූර්ව ශක්‍යතා අධ්‍යයනයක් අභ්‍යන්තරව සිදුකරන ලදී

ඉන් අනතුරුව, චීන වරයා තෙල් ටැංකි සංකීර්ණය සන්තකයේ තබා ගැනීම, සංවර්ධනය කිරීම සහ භාවිතය සඳහා වූ ක්‍රමවේද" 2022 ජනවාරි මස අත්සන් කරන ලද ගිවිසුමටමගින් චීන වරායේ ඉහළ ටැංකි සංකීර්ණයහි වානේ ගබඩා ටැංකි 24ක් CPC වෙත ලැබී ඇත. තවද, බලශක්ති අමාත්‍යතුමාගේ මඟපෙන්වීම යටතේ ඉහළ ඉහල ටැංකි සංකීර්ණයේ ටැංකි 61 ක් සංවර්ධනය කිරීම සඳහා 2021.12.24 දින ට්‍රින්කෝ පෙට්‍රෝලියම් ටර්මිනල් (පීටීවී) එල්ටීඩී (TPTL) CPC අනුබද්ධ සමාගමක් ලෙස පිහිටුවන ලදී.

**(ඈ) සපුගස්කන්ද තෙල් පිරිපහදුව**

(i)පෙර විගණන වාර්තාවල සඳහන් පරිදි, දශක පහකට පෙර ඉදිකරන ලද (1969 දී ආරම්භ කරන ලද) පිරිපහදුව පුළුල් කිරීමේ සහ එය නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය විවිධ හේතූන් මත සැලකිය යුතු දැනට පවතින පිරිපහදුව වැඩි දියුණු කර අඩුම මිලට රටේ ඉල්ලුම සපුරාලීම

| | | |
|---|---|---|
| දැනට පවතින පිරිපහදුව මූලික මට්ටමේ පිරිපහදුවක් වන අතර, රට තුළ වැඩිවෙමින් පවතින ඛනිජ තෙල් නිෂ්පාදනවල ඉල්ලුම සපුරාලීමට මෙය ප්‍රමාණවත් නොවේ. අඩු පිරිවැයකින් ඛනිජ තෙල් නිෂ්පාදන නිපදවීමේ පහසුකම් සහිත, පෙට්‍රල් සහ ඩීසල් වැනි පහළ මට්ටමේ නිෂ්පාදන, ඉහළ වටිනාකමකින් යුත් නිෂ්පාදන දක්වා ඉහළ නැංවීමේ හැකියාව සහිත සහ එමගින්, එහි මෙහෙයුම් කාර්යක්ෂමතාව උපරිම කරනු ලබන උසස් තාක්ෂණයන්ගෙන් ක්‍රියාත්මක වන පිරිපහදු සමඟ සසඳන විට, මෙම පිරිපහදුව අඩු කාර්යක්ෂමතාවකින් ක්‍රියාත්මක වේ. කෙසේවෙතත්, ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට එහි නිෂ්පාදන වෙළඳපොළට සැපයීම පිරිවැය ඵලදායී ආකාරයෙන් සිදු කිරීම සඳහා, යෝජිත සපුගස්කන්ද තෙල් පිරිපහදුව පුළුල් කිරීමේ හා නවීකරණය කිරීමේ (SOREM) ව්‍යාපෘතිය හෝ විකල්ප ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි. තවද, එකී අරමුණ සඳහා රු. මිලියන 1,003 ක පිරිවැයකට අත්පත් කර ගත් ඉඩම මෙම වාර්තාවේ දිනය දක්වාම නිශ්කාර්යව පැවතුණි. | කාලයක තිස්සේ (වසර 10කට වැඩි) නතර කර ඇති අතර ව්‍යාපෘතියේ ශක්‍යතාවය නැවත සොයා බැලීම අවශ්‍ය විය. ඒ අනුව මූලික පූර්ව ශක්‍යතාව අධ්‍යනයක් අභ්‍යන්තර කණ්ඩායමක් විසින් සිදු කරන ලදී. ඉන් අනතුරුව දැනට පවතින පිරිපහදුවට අත්‍යාවශ්‍යයන්ම වෙනස්කම් සිදු කරමින් BOT පදනම මත වෙනම නව 100,000 bbl./d පිරිපහදුවක් ස්ථාපනය කිරීමේ අරමුණින් කැබිනට් අමාත්‍යවරුන්ගේ අනුමැතිය ඇතිව M/S KBS Technologies Pvt Ltd විසින් පුළුල් ශක්‍යතා අධ්‍යනයක් සිදු කරන ලදී. පිරිපහදු ආයතනය සඳහා යෝජනා සඳහා ඉල්ලීම් (RFP) කැඳවීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කිරීම සඳහා රේඛීය අමාත්‍යාංශය විසින් අමාත්‍ය මණ්ඩල සංදේශයක් සකස් කර ඒ සඳහා අනුමැතිය ඉල්ලා ඇත.<br><br>ව්‍යාපෘතිය සඳහා අක්කර 100ක අමතර ඉඩමක් අවශ්‍ය බව හඳුනාගෙන ඇති අතර අක්කර 23ක් පමණ අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය දැනටමත් ආරම්භ කර ඇත. | සඳහා නව පිරිපහදුවක් ඉදිකිරීමට අවධානය යොමු කළ යුතුය. |
| (ii)බොරතෙල් හිඟය හේතුවෙන් පිරිපහදුව කිහිප වතාවක්ම වසා දමා තිබූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස සැලකිය යුතු මානව සම්පත් සහ අනෙකුත් සම්පත් සැලකිය යුතු ලෙස අක්‍රිය විය. කෙසේ වෙතත්, සියලු කරුණු සවිස්තරාත්මකව අධ්‍යයනය කර පිරිපහදුව පවත්වාගෙන යාමේ ආර්ථික හා සමාජීය වටිනාකම පිළිබඳ විධිමත් ඇගයීමක් ආයතන මට්ටමින් මෙතෙක් සිදු කර නොමැත. | කළමනාකරණය අදහස් දක්වා නොමැත | පිරිපහදුව වසාදැමීමට තීරණය ගැනීමට ප්‍රථම ආර්ථික හා සමාජ බලපෑම ඇගයීම කල යුතුය |

## 3.3. නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)වනාතමුල්ලේ පිහිටි හල්ගහකුඹුර ඉඩම එල්පී ගෑස් ව්‍යාපෘතිය සහ ක්‍රීඩා භූමියක් සඳහා රු.මිලියන 10.6 කට අත්කර ගෙන තිබුණි. එසේ වුවත්, මෙම ඉඩම අදාළ අභිමතාර්ථය සඳහා යොදාගෙන නොතිබුණු අතර එහි ප්‍රතිඵලයක් ලෙස එම ඉඩමේ අනවසර නිවාස 700 කට අධික ප්‍රමාණයක් ඉදිකර තිබුණි. | එහි සඳහන් කර ඇති කරුණ නිවැරදිය. | අනවසර පදිංචිකරුවන් ඉවත් කර එම දේපළ සංස්ථාවේ උන්නතිය සඳහා යොදා ගැනීමට පියවර ගත යුතුය. |
| (ආ)විගණයට ලැබී ඇති තොරතුරු අනුව, සංස්ථාව විසින් රු. මිලියන 0.63ක මුදලකට මහහේන ඉඩම අත්පත් කර ගෙන තිබුනද, සංස්ථාවේ පොත්වල ගිණුම්ගත කර නොතිබුණි. කෙසේ වුවද මෙම ඉඩම 1986 වර්ෂයේ අත්පත් කර ගැනීමෙන් පසුවද පෙර අයිතිකරුවන් විසින් අඛණ්ඩව භාවිතා කරමින් පැවතුණි. | ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වන්දි මුදල් කොළොන්නාව ප්‍රාදේශීය ලේකම්වරයා වෙත තැන්පත් කර තිබුණද මෙම ඉඩම්වල පෙර අයිතිකරු ඉවත් කර ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට ලබාදීමට කොලොන්නාව ප්‍රාදේශීය ලේකම්වරයා පියවර ගෙන නොමැත. | -එම - |

## 3.4. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සංස්ථාවේ විධායක සේවා කාණ්ඩය සඳහා බඳවා ගැනීමේ සහ උසස්වීම් යෝජනා ක්‍රමය (SORAP) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් 2017 මැයි 05 දින අනුමත කර ඇත. කෙසේ වෙතත්, සංස්ථාවේ එම කාණ්ඩයට බඳවා ගැනීමේදී සහ උසස්කිරීමේදී අනුමත වෘත්තීය සහ අධ්‍යයන සුදුසුකම් සහ අත්දැකීම්වල අවම අවශ්‍යතාවයට අදාළ ප්‍රතිපාදන නොසලකා කටයුතු කර තිබුණි. එහි ප්‍රතිපලයක් ලෙස අදාල වෘත්තීය අධ්‍යාපන සුදුසුකම් සහ පළපුරුද්ද සහිත වඩාත් සුදුසු නිලධාරීන් බඳවා ගැනීම සහ ඔවුන් තනතුරේ තබාගැනීමට වසර 06ක් තිස්සේ සංස්ථාවට නොහැකි වී ඇත | අපි දැනටමත් ‘A’ ,’B’ සහ ‘C’ ශ්‍රේණි සඳහා සංශෝධිත බඳවාගැනීම් සහ උසස්වීම් පටිපාටිය (SORAP) අනුමැතිය සඳහා විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය හරහා භාණ්ඩාගාරය වෙත යොමු කර ඇත. | සියලුම බඳවා ගැනීම්, උසස්වීම් ආදිය අනුමත SORAP අනුව සිදු කළ යුතුය. |

(ආ)සංස්ථාව විසින් මෝටර් වාහන ණය, නිවාස ණය, නිවාස අලුත්වැඩියා ණය, ආපදා ණය, සකසුරුවම් සමිති ණය, විශේෂ ණය, disturbance අත්තිකාරම් ආදී ණය යෝජනා ක්‍රම ගණනාවක් සිය කාර්ය මණ්ඩලය වෙත හඳුන්වා දී ඇත. 2022 දෙසැම්බර් 31 දිනට ශේෂය රු. මිලියන 4,300 කි. විගණනයට ලැබී ඇති තොරතුරුවලට අනුව, ප්‍රමාණවත් අරමුදල් නොමැතිකම හේතුවෙන්, ඉතා හදිසි සහ වැදගත් ප්‍රාග්ධන වැඩිදියුණු කිරීමේ කටයුතු ප්‍රමාද කිරීමට හෝ කල් දැමීමට සංස්ථාවට සිදු වූ බව නිරීක්ෂණය විය. සංස්ථා අරමුදල් භාවිතා කරමින් විශාල ණය කළඹක් පවත්වාගෙන යාම ඊට අයහපත් ලෙස බලපානු ඇත. කෙසේ වෙතත්, සේවකයින් අපහසුතාවට පත් නොවී ඉහත ගැටළු මඟහරවා ගැනීම සඳහා ණය යෝජනා ක්‍රම වාණිජ බැංකුවකට හෝ මූල්‍ය ආයතනයකට බාහිරින් ලබා දීම කෙරෙහි නිසි අවධානය යොමු කර නොතිබුණි.

සේවක ප්‍රතිලාභයක් ලෙස සහ සේවකයන් රඳවා ගැනීමට කාර්යමණ්ඩල ණය සේවකයන්ට ලබා දේ. වැටුපෙන් මාසිකව ණය අයකර ගන්නා බැවින් මුදල් ප්‍රවාහනයට විශාල බරක් නොමැත.

සංස්ථාවේ මූල්‍ය ස්ථාවරත්වය වර්දනය සඳහා ණය යෝජනා ක්‍රමය බාහිරින් ලබා දීමට ක්‍රියාමාර්ග ගත යුතුය.